# 2018

## වාර්ෂික වාර්තාව සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

## ஆண்டறிக்கை மற்றும் வருடாந்த நிதிக் கூற்றுக்கள்

# Annual Report and Annual Financial Statements

IHRA
UNIVERSITY OF COLOMBO


මානව සම්පත් අභිවර්ධන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය

மனிதவள மேம்பாட்டு நிறுவகம், கொழும்புப் பல்கலைக்கழகம்

**Institute of Human Resource Advancement, University of Colombo**

# දැක්ම

"ගෝලීය සන්දර්භය තුළ අභිවර්ධනීය සමාජයක සංවර්ධනයෙහි ලා මානව කුසලතා සංවර්ධනයට ඉගෙනුම්, ඉගැන්වීම් සහ පර්යේෂණ දායකත්වයේ විශිෂ්ටතම මධ්‍යස්ථානය බවට පත් වීම"

# මෙහෙවර

"මානව සම්පත සංවර්ධනයට, අති නවීන තාක්ෂණයන් සහ ක්‍රමවේද උපයෝග කොටගනිමින් දක්ෂ මෙන්ම මනාව කැපවූ කාර්ය මණ්ඩලයක් හරහා නායකත්වයේ තරගකාරි සංවර්ධනය, ව්‍යවසායකත්වය, සහ විවේචනාත්මක චින්තන හැකියාවන් සමඟ උසස් සමාජ සදාචාර ප්‍රමිතීන් ඉලක්කකොට අනේකවිධ කළමනාකරණ, කළමනාකරණ-නොවන රැකියා නියුක්තිකයන් සහ ව්‍යවසායකයින් උදෙසා ජාතික වශයෙන් තරගකාරි සහ ජාත්‍යන්තරව පිළිගත් ඉගෙනුම්, පර්යේෂණ සහ සංවර්ධන අවස්ථා සම්පාදනය කිරීම"

# වටිනාකම්

## වටිනාකම 01

### අධ්‍යාපනයේ නිදහස

විධිමත් උසස් අධ්‍යාපන අධ්‍යයන අවස්ථා අහිමිව සේවයේ නියුක්තව සිටින කළමනාකාරි නොවන සේවා නියුක්තිකයින් උදෙසා නිදහස් අධ්‍යාපනය අඛණ්ඩව සම්පාදනය කරන අතරම, උසස් අධ්‍යාපනික අවස්ථා පූරණය කර ගැනීමට නොහැකිවූ කළමනාකාරි සේවා නියුක්තිකයන්, සහ වෘත්තිකයන් සංවර්ධනය කිරීම අපි අගය කරනෙමු.

## වටිනාකම 02

### අභිවර්ධනීය චින්තනය

එකිනෙකාගේ කාර්යභාරය ඉහළම කාපවීමකින් සිදු කරමින් අපගේ සාමූහික ප්‍රයත්නයේ ප්‍රතිඵල සාධාරණාත්මකව බෙදා ගනිමින් සහ අප ළඟා කරගත් දේ මානව සම්පත් අභිවර්ධන ආයතනය තුළ හා ඉන් පිටත අනාගත පරපුරට තිරසාරව පවත්වා ගනිමින් සහ දියුණු කරමින් සමාජයේ අභිවර්ධනය සඳහා සාමූහිකව කටයුතු කිරීම අපි අගය කරනෙමු.

## වටිනාකම 03

### විවිධත්වය හා අන්තර්ගතය

අප විවිධත්වය අගය කරනවා පමණක් නොව, අපගේ ආයතනය සහ සමාජය විසින් විවිධත්වයෙන් ප්‍රතිලාභ ලබා ගැනීම සහතික කිරීම උදෙසා අපගේ සාරධර්ම, විශ්වාස, පසුතල, කුසලතා සහ කාර්යය දිශානතියෙහි වෙනස්කම් පිළිගෙන ප්‍රවර්ධනය කරන අන්තර්ග්‍රහණීය කාර්යය සංස්කෘතියක් අපි අගය කරන්නෙමු.

## වටිනාකම 04

### ප්‍රජාවගේ ජීව ගුණය

එකම අරමුණක් පෙරදැරි කොට ඒකීය අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීම වෙනුවෙන් ඒකීය ප්‍රජාවක් ලෙස 'මම' නොව 'අප' යන ගුණය ගොඩ නැගීමට හේතු පාදක වන අභිලාෂයන්ගෙන් යුක්තවන්නා වූ මානව ප්‍රජාවක් බවට පත්වීමට කටයුතු කිරීම අපි අගය කරනෙමු.

## වටිනාකම 05

### අප සිදු කරන දෑ පවරා දීම

මානව සම්පත් අභිවර්ධන ආයතනික ප්‍රජාවගේ සහ ඉන් පරිබාහිර ප්‍රජාවගේද සදාචාරාත්මක නිවැරදි පැවැත්ම අප දිරිගන්වනු ලබන අතර දැනුම සහ තොරතුරු එක් රැස් කිරීමේ අසීමාන්තික අයිතිය උසස් අධ්‍යාපන ඉගෙනුම් සම්පාදන ආයතනයක් පවත්වා ගත යුතු රහස්‍යභාවය තහවුරු කරමින් පවත්වාගෙන යාම අපි අගය කරමු.

# අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය

"අපගේ සමාජය ප්‍රගතියට හා ඉදිරියට යා යුතු බව අපි විශ්වාස කරමු. එමෙන්ම ප්‍රගතිය ක්‍රමානුකූලව දිගින් දිගටම පවත්වා ගැනීමට අපි උත්සහ කරන්නෙමු. එම ප්‍රගතිය අපගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික සහ දේශපාලනික අභිලාෂයන් සාකල්‍යව වැළඳ ගැනීම අපි ඉලක්ක කරමු. ප්‍රගතිශීලි සමාජයක් යනු එහි ජීවත් වන ජනතාවගේ සමාජ, සංස්කෘතික සහ දේශපාලන අභිලාෂයන් යථාර්ථයක් බවට පත් කරන්නා වූ සංසදයක් බව අපි විශ්වාස කරන්නෙමු."

2018 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව මා විසින් ඉදිරිපත් කරන්නේ ඉමහත් ප්‍රීතියකිනි. එකී වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය විෂය ක්ෂේත්‍ර ගණනාවක හා පශ්චාත් උපාධි, ප්‍රථම උපාධි, ඩිප්ලෝමා සහ සහතික පත් ලෙස විවිධ මට්ටම් දක්වා පුළුල් පරාසයක අධ්‍යයන පාඨමාලා සම්පාදනය කරමින් ප්‍රමුඛ පෙළේ අධ්‍යයන ආයතනයක් ලෙස අඛණ්ඩව ජාතියට සේවය සම්පාදනය කරන ලදී. වසරේ සැලකිය යුතු විශේෂතම කරුණක් වූයේ අප විසින් ආරම්භ කරන ලද මූලික වෙනස්කිරීම් ඉදිරියට පවත්වාගෙන යාමට අපගේ කැපවීම, අපගේ මානව සම්පත් සංවර්ධනයෙහි ලා කරන ලද ආයෝජනයෙන් මනාව පැහැදිළි වීමයි.

2018 වර්ෂයේ දී මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අනාගතයට මුහුණ දීමට ඇති සූදානම්බව පෙන්නුම් කරනු ලබන අඛණ්ඩ වර්ධනයේ, සුවිශේෂ ජයග්‍රහණ ගණනාවක් අත් කර ගැනීමට හැකිවිය. පළමුව, ආයතනය ප්‍රතිව්‍යුහගත කරන ලද පශ්චාත් උපාධි, විධායක/ උසස් ඩිප්ලෝමා සහ ඩිප්ලෝමා වැනි අධ්‍යයන වැඩසටහන් ආරම්භ කරන ලදී. දෙවැනුව, නව ඒකක ආරම්භ කරමින්, සේවකයන් පුහුණු කරමින් සහ ආයතන නියමාවලිය සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස බාහිර පාර්ශවයන් හා කටයුතු කරමින් ආයතනය ප්‍රති ව්‍යුහගත කිරිම සිදු කරගෙන යන ලදී. තවද, පෙර වර්ෂයේදී ආරම්භ කරන ලද භෞතික වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති ගණනාවක් සම්පූර්ණ කිරීමට අපට හැකි විය.

2018 වර්ෂයේදී ආයතනයේ ජාත්‍යන්තරකරණය වැඩි දියුණු කිරීමට අප විසින් අවධානය යොමු කෙරුණු අතර විදේශ විශ්වවිද්‍යාල හා සමීපව කටයුතු කරමින් ශිෂ්‍ය හුවමාරු වැඩසටහන්, තෙවන පාර්ශව පුහුණු වැඩසටහන් 2019 දී අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරෙමින් පවතී. අපගේ ජාත්‍යන්තරකරණය ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සඳහා වෙනම ඒකකයක් අප විසින් ස්ථාපිත කරන ලද අතර තෝරා ගත් විදේශ විශ්වවිද්‍යාල සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සඳහා ද මූලිකත්වය ගෙන කටයුතු කරන ලදී.

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ප්‍රමුඛතම වැඩසටහන වන ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව සඳහා 2018 වර්ෂයේදී නවක විද්‍යාර්ථීන් 221 ක් ලියාපදිංචි වූ අතර ආසන්න වශයෙන් විද්‍යාර්ථීන් 522 ක් පමණ මෙම පාඨමාලාව හදාරනු ලබයි. තවද, ජ්‍යෙෂ්ඨ කළමණාකරන මට්ටමේ හෝ වෘත්තික මට්ටමේ විද්‍යාර්ථීන් 732ක් පමණ පශ්චාත් උපාධි අධ්‍යයනයේ නිරත වූ අතර එම වැඩසටහන් නම්ඃ ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව, මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව, සේවා කළමනාකරණ විද්‍යාපති උපාධි පාඨමාලාව, භූ තොරතුරු විද්‍යාපති පාඨමාලාව සහ ආපදා විශ්ලේෂණ කළමනාකරණය සහ පාලන විද්‍යාපති පාඨමාලාව වේ.

2018 අධ්‍යයන වර්ෂය තුළ තමන් සතු විෂයානුබද්ධ දැනුම වැඩි දියුණු කර ගැනීම සඳහා ඩිප්ලෝමා පාඨමාලාවන්හි ලියාපදිංචි වූ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 252ක් වූ අතර සහතිකපත් පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වූ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 4,562ක් විය. වර්ෂය තුළ දී මානව සම්පත් අභිවර්ධන ආයතනය වැඩමුළු 13ක් පවත්වන ලද අතර තම ඉගෙනුම් අත්දැකීම් වැඩි දියුණු කර ගැනීම පිණිස ශිෂ්‍ය ශිෂ්‍යාවෝ 1,839ක් මෙම වැඩමුළු සඳහා සහභාගී වූහ.

කොළඹ විශ්වවිද්‍යාලයීය මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අපි, ප්‍රගතිශීලි සමාජයක ජීවත් වන ජනයා වෙනුවෙන් උතුම් ඉලක්ක දෙකක් දියත් කර ඇත්තෙමු. එනම්ඃ අවශ්‍ය කරන්නා වූ ප්‍රමාණයෙන් සහ ගුණාත්මකභාවයෙන් මානව කුසලතා සංවර්ධනය, සාමූහික තෝරාගැනීම් සහ සාමූහික ප්‍රයත්නයන් ළඟා කර ගැනීම වෙනුවෙන් සේවකයන් සහ කළමනාකරුවන් දැනුවත් කිරීම වශයෙනි. ප්‍රගතිශීලි සමාජයක ජීවත් වීමේ සිහිනයක් ඇති සහ අනෙක් පුද්ගලයන් එහි ජීවත්වනු දැකීමට කැමති සැමට, එම සිහිනය යථාර්ථයක් බවට පත් කර ගැනීමට අපි, කොළඹ විශ්වවිද්‍යාලයීය මානව සම්පත් අභිවර්ධන ආයතනය හා එක් වන මෙන් ආරාධනා කරමු.





මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි
අධ්‍යක්ෂ සහ ශාස්ත්‍රීය කමිටු සභාපති

# පටුන


**01 - 04**

**1.** **මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ඉතිහාසය**
1.1. මානව සම්පත් අභිවර්ධන ආයතනය ගැන කෙටියෙන්
1.2. 2018 වර්ෂය තුළ මා.ස.අ. ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයන පාඨමාලා
1.3. මා.ස.අ. ආයතනයේ කළමනාකාරීත්වය
1.4. මා.ස.අ. ආයතනයේ පරිපාලනමය සංවිධාන ව්‍යුහය (2018)
1.5. මා.ස.අ. ආයතනයේ ශාස්ත්‍රීය කමිටුව
1.5.1. මා.ස.අ. ආයතනයේ ශාස්ත්‍රීය කමිටු සාමාජිකන් (රැස්වීම වාර 13ක් පවත්වා ඇත)
1.5.2. මා.ස.අ. ආයතනයේ අධ්‍යයන මණ්ඩලය මඟින් පවත්වන ලද රැස්වීම් වාර ගණන

**05 - 08**

**2.** 2018 **වර්ෂය තුළ ලබා ගත් ජයග්‍රහණ සහ සංවර්ධන කාර්යයන්**
2.1 සංවර්ධනය
2.2 ජයග්‍රහණ
2.2.1 අධ්‍යාපනික ජයග්‍රහණයන්
2.2.2 පරිපාලනමය ළඟා කර ගැනීම්
2.2.3 භෞතික පහසුකම් ළඟා කර ගැනීම
2.3 ශිෂ්‍ය කුසලතා සංවර්ධනය
2.4 මා.ස.අ. ආයතනයේ ශිෂ්‍යයන්ගේ සහ කාර්මණ්ඩලයේ විෂය බාහිර ක්‍රියාකාරකම් (සංවිධානය කළ සහ සහභාගී වූ)
2.5 මා.ස.අ. ආයතනයේ ආයතනික සමාජ වගකීම

**09 - 18**

**3.** 2018 **වර්ෂයේ සමාලෝචනය**
3.1 අධ්‍යයන පාඨමාලා
3.1.1 පශ්චාත් උපාධි පාඨමාලා
3.1.2 ප්‍රථම උපාධි පාඨමාලාව
3.1.2.1 ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව
3.1.3 විධායක ඩිප්ලෝමා පාඨමාලා
3.1.4 ඩිප්ලෝමා පාඨමාලා
3.1.5 සහතිකපත්‍ර පාඨමාලා
3.2 2018 වර්ෂයේ පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු
3.2.1 මා.ස.අ. ආයතනයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම
3.3 පර්යේෂණ, නවෝත්පාදනයන්, සහ ප්‍රකාශන පිළිබඳ තොරතුරු
3.4 අධ්‍යයන කාර්ය මණ්ඩලය, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තොරතුරු
3.5 පුස්තකාලය

**19 - 31**

**2018 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන**
1. ආයතනික තොරතුරු
1.1 වාර්තා කිරීමේ ආයතනය - නිත්‍ය හා නෛතික ආකෘතිය
1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම්වල ස්වභාවය
1.3 මූල්‍ය කාලපරිච්ඡේදය
2. පිළියෙල කිරීමේ පදනම
2.1 පිළියෙල කිරීමේ පදනම
2.2 ඉදිරිපත් කිරීම සහ කෘත්‍යාත්මක මුදල්
2.3 අනුකූලතා ප්‍රකාශය
2.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම
2.5 ප්‍රවර්තන ව්‍යාපාර
2.6 වාර්තාකරණ දිනයට පසු සිද්ධි
2.7 සංසන්දනාත්මක සංඛ්‍යා
2.8 ද්‍රව්‍යමයභාවය හා එකතුව
2.9 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පන

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හි සාරාංශය
3.1 බදු
අ. ආදායම් බද්ද
ආ. උපයන විට ගෙවීමේ බද්ද
ඇ. ජාතිය ගොඩනැගීමේ බද්ද
3.2 ස්ථාවර වත්කම්
3.3 කෙටි කාලීන ආයෝජනයන්
3.4 තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ වත්කම්
3.5 වෙළඳාම් හා අනෙකුත් අයවිය යුතු
3.6 පාරිතෝෂිකය
3.7 විශ්වවිද්‍යාල අර්ථසාදක අරමුදල හා සේවක භාරකාර අරමුදල
3.8 වියදම් හඳුනාගැනීම
3.9 ජංගම වගකීම්
3.10 ණය හිමියන් සහ සහතික කළ වියදම්
3.11 අවිනිශ්චිත වගකීම්
3.12 ප්‍රාග්ධන ප්‍රදාන
3.13 පුනරාවර්තන ප්‍රදාන
3.14 සීමාකරන ලද අරමුදල්
3.15 ආදායම් හඳුනා ගැනීම
3.16 මුදල් ප්‍රවාහ ප්‍රකාශ
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම/ශුද්ධ වත්කම්වල වෙනසක පිළිබද ප්‍රකාශය
2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශ
මුදල් ප්‍රකාශ සඳහා සටහන
32 - 34 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ III වන කොටසේ අංක 17 (ඇ) යටතේ දක්වා ඇති තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව - 2019
35 - 52 විගණන වාර්තා

# 1. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ඉතිහාසය

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ඉතිහාසය දශක හතරකට වඩා උරුමකම් කියන අතර එහි පූර්වක ආයතනය වූ සේවක අධ්‍යාපන ආයතනය 1979 අංක 11 දරන නියමාවලිය යටතේ 1975 වර්ෂයේ දී ස්ථාපනය කරන ලදී. 2006 වර්ෂයේ දී සේවක අධ්‍යාපන ආයතනය, මානව සම්පත් අභිවර්ධන ආයතනය ලෙස නම් කරන ලද අතර එය 2006 අංක 01 දරන නියමාවලිය මගින් සංශෝධනය කරනු ලැබිණි. 2017 අගෝස්තු 22 දිනැති අංක 2033/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංශෝධිත නියමාවලිය මගින් මානව සම්පත් අභිවර්ධන ආයතනයට උපාධි, ඩිප්ලෝමා, සහතිකපත් සහ අනෙකුත් අධ්‍යයන විශිෂ්ටතා සහතික පිරිනැමීමට අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා ලදී. මානව සම්පත් අභිවර්ධන ආයතනය රටේ පැරණිතම විශ්වවිද්‍යාලය සහ හොඳම විශ්වවිද්‍යාල 1000 තුළට ගැනෙන කොළඹ විශ්වවිද්‍යාලය යටතේ පවතින ආයතනයකි.

වසර හතරකට අධික ඉතිහාසය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය එහි පරිස්ථිතිය තුළ වෙනස්කම් සහ නව සංවර්ධනයන් රැසක් අත්දැක ඇති අතර පෞද්ගලික අංශයේ වර්ධනය, දැනුම් ආර්ථිකයේ නිර්ගමනය හා ශ්‍රම බලකායේ ගෝලීයකරණය මේ අතරින් සැලකිය යුතු කීපයකි. මෙම සංවර්ධනයන් වැළඳ ගැනීමට දරන ප්‍රයත්නයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය අඛණ්ඩව පරිණාමය වී ඇති අතර "සේවා කණ්ඩායම්" සඳහා අධ්‍යාපනය ලබා දීමේ එහි මුල් අභිමතාර්ථය නව අර්ථයක් ගෙන ඇත. වර්තමානයේදී "සේවා කණ්ඩායම්" ලෙස "කළමනාකරණ/වෘත්තීමය සේවා කණ්ඩායම්" අර්ථ ගන්වන අතර මානව සම්පත් අභිවර්ධන ආයතනය මෙම මානව කුසලතා සංවර්ධනය සඳහා කැප වී සිටියි.

කොළඹ විශ්වවිද්‍යාලයීය ආයතනයක් වීම තුළ ආයතනයේ අධ්‍යයන කටයුතු කොළඹ විශ්වවිද්‍යාලයේ දැඩි අධීක්ෂණයට ලක් වේ. ඕනෑම උසස් අධ්‍යාපන ආයතනයක් පවත්වා ගත යුතු අධ්‍යයන කටයුතුවල උසස් ප්‍රමිතීන් පවත්වා ගැනීම සහ යහපත් සම්ප්‍රදායන් ඉදිරියටත් පවත්වාගෙන යාම සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය බැඳී සිටී.

මානව සම්පත් අභිවර්ධන ආයතනය මූලිකවම ආරම්භ කරන ලද්දේ සියලුම කාණ්ඩවල සේවකයන්ට ඔවුන්ගේ කුසලතා නායකත්ව ගුණාංග සහ ශ්‍රමිකයන් ලෙස ඔවුන්ගේ වගකීම් පිළිබඳ පිළිගන්නා ගුණාත්මකභාවයෙන් යුත් පෘථුල උසස් මට්ටමේ අධ්‍යාපනයක් ලබා දීම සඳහා පහසුකම් සැලසීමටය. එමඟින් ඔවුන්ට තම සේවා ස්ථානයන්හි ඵලදායී දායකත්වයක් ලබා දීමට හැකිවන අතර 1983 වන තෙක්ම ප්‍රදානය කරන ලද්දේ ශාස්ත්‍රවේදී උපාධියක් වශයෙනි. කෙසේ වුවද 1986 වර්ෂයේදී සේවක අධ්‍යාපන ආයතනය ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය පිරිනැමීම ආරම්භ කරන ලද අතර 2007 වර්ෂයේ දී මානව සම්පත් අභිවර්ධන ආයතනය සිය අධ්‍යයන ක්‍රියාකාරකම් ව්‍යාප්ත කරමින් පශ්චාත් උපාධි පිරිනැමීම ද ආරම්භ කරන ලදී.

## 1.1 මානව සම්පත් අභිවර්ධන ආයතනය ගැන කෙටියෙන්

2018 වර්ෂයේ දී මානව සම්පත් අභිවර්ධන ආයතනය පශ්චාත් උපාධි විද්‍යාර්ථීන් 800ක් ඇතුළත්ව සිසු සිසුවියන් 6,000කට අධික සංඛ්‍යාවක් සඳහා අධයාපනය ලබා දී ඇත. මානව සම්පත් අභිවර්ධන ආයතනය, එය පිහිටුවා ඇති අරමුණ සැලකිල්ලට ගෙන ගතික අධ්‍යයන වැඩසටහන් පිරිනමනු ලබයි. මානව සම්පත් අභිවර්ධන ආයතනය ප්‍රධාන වශයෙන්ම සේවය සපයනු ලබන්නේ වැඩකරන ප්‍රජාවට ඔවුන්ගේ වැඩ පරිසරයට ගැළපෙන පරිදි සිය කුසලතා, හැකියාවන් සහ නායකත්ව කුසලතා දියුණු කර ගැනීමටය.

2018 වර්ෂයේදී පාඨමාලා කාණ්ඩ 04ක් යටතේ සිසු සිසුවියන් 6,000කට අධික සංඛ්‍යාවකට සේවය සැලසීමට අපට හැකි වූ අතර, 2019-2020 කාල පරිච්ඡේදය සඳහා උපායමාර්ගික සැලැස්මට දායකත්වය දක්වමින් පශ්චාත් උපාධි පාඨමාලා 05ක් එක් ප්‍රථම උපාධි පාඨමාලාවක්, ඩිප්ලෝමා පාඨමාලා 04ක් සහ සහතිකපත් පාඨමාලා 08ක් පැවැත්වීමට ආයතනයට හැකි විය.

ශිෂ්‍ය ලියාපදිංචිය - 2018




මූලාශ්‍රය - රැස් කළ දත්ත 2018, මා.ස.අ.ආ

2018 වර්ෂය තුළ ඉහත දක්වා ඇති පරිදි සමස්ත සිසු සිසුවියන් 6,207ක් විවිධ අධ්‍යයන පාඨමාලා හදාරන ලදී.

## 1.2. 2018 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය විසින් පවත්වන ලද අධ්‍යයන පාඨමාලා

**ප්‍රථම උපාධි පාඨමාලාව**

- ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව

**පශ්චාත් උපාධි පාඨමාලා**

- සේවා කළමනාකරණ විද්‍යාපති උපාධි පාඨමාලාව
- භූ තොරතුරු විද්‍යාපති උපාධි පාඨමාලාව
- ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව
- මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව
- ආපදා විශ්ලේෂණය කළමනාකරණය සහ පාලනය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව

**විධායක/උසස් ඩිප්ලෝමා සහ ඩිප්ලෝමා පාඨමාලා**

- උපදේශනය සහ මනෝවිද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලෝමාව පාඨමාලා
- මත්ද්‍රව්‍ය දුර්භාවිතය කළමනාකරණ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- උපදේශනය සහ මනෝවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව
- අතිරේක භාෂාවක් ලෙස දමිළ භාෂා ඩිප්ලෝමාව
- ශ්‍රම අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

**සහතිකපත් පාඨමාලා**

- පරිගණක යෙදවුම් පිළිබඳ සහතිකපත් පාඨමාලාව
- ඉංග්‍රීසි භාෂාව පිළිබද සහතිකපත් පාඨමාලාව
- ගුරුවරුන් සඳහා ඉංග්‍රීසි පිළිබඳ සහතිකපත් පාඨමාලාව
- පාසල් හැරයන්නන් සඳහා වූ කෙටිකාලීන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව
- කථන ඉංග්‍රීසි භාෂා පාඨමාලාව
- ඉංග්‍රීසි භාෂා පදනම් සහතිකපත් පාඨමාලාව
- දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - මූලික
- දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - අන්තර්මධ්‍යම

අභියෝගාත්මක ගෝලීය තත්ත්වයන් හමුවේ මුහුණ දීම මෙන්ම අපගේ ජාතික සංවර්ධනයේ මානව පදනම ශක්තිමත් පරිණත, බුද්ධිමත් දැනුම භාවිත කරන්නන් ලෙස මානව සම්පත අභිවර්ධනය කිරීමට මානව සම්පත් අභිවර්ධන ආයතනය බලාපොරොත්තු වේ. මෙම අරමුණ මුදුන් පමුණුවා ගැනීම උදෙසා මානව සම්පත් අභිවර්ධන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලයෙන් උරුම වී ඇති ධනාත්මක ශාස්ත්‍රීය සම්ප්‍රදායන් සහ උසස් ශාස්ත්‍රීය ප්‍රමිතීන් තහවුරු කර ගනිමින් විශාල පරිවර්තනයක් සිදු කරමින් සිටී. යහපාලනයේ ප්‍රමිතීන් සපුරාලීම, ආයතන අධ්‍යයන වැඩසටහන් සඳහා දේශීය හා ගෝලීය ප්‍රතීතන ලබා ගැනීම සහ එමගින් සමාජීය වගකීමකින් යුත් යහසේවක වෙළඳ නාමයක් ඇති රාජ්‍ය ආයතනයක් බවට පත්වීම මෙම පරිවර්තනයේ අරමුණ වේ.

## 1.3. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කළමනාකරිත්වය

පූර්ණ කාලීන නිලධාරියෙකු ලෙස සේවය කරන ආයතනයේ පරිපාලනමය සහ අධ්‍යයන ප්‍රධානියා වන ආයතනයේ අධ්‍යක්ෂවරයා, මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ශාස්ත්‍රීය කමිටුවේ නිර්දේශය මත කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ එකඟතාව සහිතව උප කුලපති විසින් පත් කරනු ලැබේ.

අධ්‍යක්ෂවරයා ශාස්ත්‍රීය මණ්ඩලයේ සභාපතිවරයා වන අතර අධ්‍යයන කමිටුව සඳහා නිලබලයෙන් පත් වූ සාමාජිකයෙකුද වේ. ඔහු ආයතනයේ ප්‍රධාන ගිණුම් නිලධාරියා ද වන අතර ආයතනය තුළ විනය පවත්වාගෙන යාමේ වගකීම දරන්නා ද වේ. 2018 ජනවාරි 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි වසර තුනක කාලයක් සඳහා ස්ථිර අධ්‍යක්ෂවරයා වශයෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ කළමනාකරණ හා සංවිධාන අධ්‍යයන අංශයට අනුයුක්තව සිටින සහය මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි මහතා සේවය කරනු ලබයි. ආයතනයේ සංවිධාන ව්‍යුහය පහත දක්වා ඇත.

## 1.4. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පරිපාලනමය සංවිධාන ව්‍යුහය (2018)




මෙම නව ව්‍යුහය ආයතනයේ සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව සකස් කොට ඇත.

## 1.5. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ශාස්ත්‍රීය කමිටුව

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පරිපාලනමය සංවිධාන ව්‍යුහයට අනුව එහි අධ්‍යයන මණ්ඩල හතර (04) ශාස්ත්‍රීය කමිටුවේ අනුමැතිය සහිතව පිහිටුවා ඇත. අධ්‍යයන විෂය ක්ෂේත්‍ර හා අදාළ ඒකක හත (07) අධ්‍යක්ෂවරයාගේ මාර්ගෝපදේශනය යටතේ පිහිටුවා ඇත.

### 1.5.1. ශාස්ත්‍රිය කමිටු සාමාජිකයන් (රැස්වීම් වාර 13ක් පවත්වා ඇත.)

| නම | පත් කරන ලද අධිකාරිය |
|---|---|
| මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි මහතා | සභාපති |
| මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා මහතා | නිල බලයෙන් පත් වූ සාමාජික |
| මහාචාර්ය කේ.ආර්.ආර්. මහානාම මහතා | නිල බලයෙන් පත් වූ සාමාජික |
| මහාචාර්ය එම්.වී. විදාණපතිරණ මිය | නිල බලයෙන් පත් වූ සාමාජික |
| මහාචාර්ය කෙනඩි ගුණවර්ධන මහතා | වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික |
| මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතා | වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික |
| මහාචාර්ය නයනි මෙලගොඩ මිය | වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික |
| *මහාචාර්ය මහින්ද සෝමතිලක මහතා (2019.05.12 දක්වා)* | වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික |
| *මහාචාර්ය ඕ.එම්.එස්. සොයිසා මහතා (2018.05.13 සිට)* | වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික |
| ආචාර්ය දිනුකා විජේතුංග මිය | වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික |
| ඩී.එම්.එස්. දසනායක මහතා | වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික |
| එන්. සෙල්වකුමාරන් මහතා | වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික |
| එච්.එම්.එන්. වරකාඋල්ල මහතා | වි.ප්‍ර.කො. විසින් පත් කරන ලද සාමාජික |
| කේ.ඒ. විමලේන්ද්‍රරාජා මහතා | මහා භාණ්ඩාගාර නියෝජිත |
| ඒ.ඒ. අසීස් මහතා | අධ්‍යයන මණ්ඩල නියෝජිත |
| එම්.ජී.ජී. හේමකුමාර මහතා | අධ්‍යයන මණ්ඩල නියෝජිත |
| කේ.පී. මාතොටආරච්චි මිය | අධ්‍යයන මණ්ඩල නියෝජිත |
| බී.කේ.පී. අබේසූරිය මිය | අධ්‍යයන මණ්ඩල නියෝජිත |

### 1.5.2. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අධ්‍යයන මණ්ඩල මඟින් පවත්වන ලද රැස්වීම් වාර ගණන

| අධ්‍යයන මණ්ඩලය | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| පශ්චාත් උපාධි අධ්‍යයන හා පර්යේෂණ මණ්ඩලය *(2017 නොවැම්බර් ස්ථාපිත කරන ලදී)* | 09 |
| ප්‍රථම උපාධි පාඨමාලා අධ්‍යයන මණ්ඩලය *(2017 දෙසැම්බර් ස්ථාපිත කරන ලදී)* | 10 |
| භාෂා ඉගෙනුම් වැඩසටහන් අධ්‍යයන මණ්ඩලය | 08 |
| ව්‍යාප්ති වැඩසටහන් අධ්‍යයන මණ්ඩලය | 09 |

ශාස්ත්‍රීය කමිටුවට සෘජුව වග කියනු ලබන කමිටු හතර (04)කින් ආයතනික ව්‍යුහය සමන්විත වේ. එම කමිටුවල විස්තර පහත දක්වා ඇත.

| කමිටුව | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| විගණන කමිටුව (ස්වාධීන කමිටුව) | 04 |
| මූල්‍ය කමිටුව | 10 |
| පුස්තකාල කමිටුව | 03 |
| තත්ත්ව ආරක්ෂණය සඳහා වන කමිටුව | 01 |



# 2. 2018 වර්ෂය තුළ ලබා ගත් ජයග්‍රහණයන්

## 2.1. සංවර්ධනයන්

- ප්‍රථම උපාධි අපේක්ෂකයන්ට වඩාත් පුළුල් අවස්ථාවක් ලබා දෙමින් ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශ සිව්(04) අවුරුදු විශේෂ උපාධියක් සඳහා සංශෝධනය කිරීමට කටයුතු කරන ලදී.

- ඩිප්ලෝමා, ප්‍රථම උපාධි, සහ පශ්චාත් උපාධි පාඨමාලාවන්හි අධ්‍යයන හා පරිපාලනමය කටයුතු සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (Learning Management System) යොදා ගැනීම පුළුල් කරන ලදී. මෙම පහසුකම් ඉගෙනුම හා ඉගැන්වීම සඳහා කඩදාසි භාවිතය අවම කරන අතර වාර්තා තබාගැනීම විධිමත්ව සිදු කිරීමට ද ඉවහල් වේ.

- ස්ථාවර වත්කම් ලේඛනය සියලුම භාණ්ඩ ලැයිස්තු ද සමඟ පරිගණකගත කරන ලදී.

- යෝජිත පුළුල් කරන ලද මානව සම්පත් අභිවර්ධන ආයතන ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීම සහ පාලන සහ මූල්‍ය අංශ එහි පිහිටුවීම.

- මානව සම්පත් අභිවර්ධන ආයතන ශ්‍රවණාගාරයේ නවීකරණ සහ අලුත්වැඩියා කටයුතු සම්පූර්ණ කරන ලදී.

- දැනට ක්‍රියාත්මක 1979 අංක 11 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලිය 2018 වර්ෂය තුළ සංශෝධන සමඟ ප්‍රතිස්ථාපනය කිරීමට ක්‍රියා කරන ලදී.

## 2.2. ජයග්‍රහණයන්

### 2.2.1. අධ්‍යාපනික ජයග්‍රහණයන්

2018 වර්ෂයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය ප්‍රධාන කාණ්ඩ හතරක් (04) යටතේ සුදුසුකම් සපුරාලන ලද උපාධිධාරී/ සුදුසුකම්ලාභීන් තුන් දහසක් (3,000) පමණ බිහි කරන ලදී.

එය විවිධ විෂය ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධිලාභීන් තුන්සිය හතක් (307) උපාධිධාරීන් එකසිය තිස් හතක් (137) උසස් ඩිප්ලෝමා/ ඩිප්ලෝමාධාරීන් එකසිය හැට හයක් (166) සහ සහතිකපත්ලාභීන් දෙදහස් දෙසිය අනූ හතකින් (2,297) සමන්විත විය.

42% පශ්චාත් උපාධි පාඨමාලා

21% ප්‍රථම උපාධි පාඨමාලාව

46% ඩිප්ලෝමා පාඨමාලා

50% සහතිකපත් පාඨමාලා




- මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය 2018 ජූනි මස 18වන දින කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී කොළඹ විශ්වවිද්‍යාලයීය උපකුලපති මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මැතිතුමාගේ ප්‍රදානත්වයෙන් පැවැත්විණි. මෙම ඩිප්ලෝමා ප්‍රධානෝත්සවයේදී ඩිප්ලෝමාලාභීන් තුන්සිය හැත්තෑ තුන් දෙනෙකුට (373) ඩිප්ලෝමා පිරිනමන ලදී.

- ඉගැන්වීම් ක්‍රම/විෂයමාලා සංවර්ධනය, පුහුණුව සහ වෘත්තීමය සංවර්ධන වැඩසටහන් පවත්වන ලදී.

- පළමු වැඩමුළුව - මිශ්‍ර ඉගෙනුම් ගවේෂණය, සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම (Exploration "Development and Implementation of Blended Learning)

- දෙවන වැඩමුළුව - මිශ්‍ර ඉගෙනුම් ගවේෂණය, සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම (Exploration "Development and Implementation of Blended Learning)

- තෙවන වැඩමුළුව - ඉංග්‍රීසි භාෂා පාඨමාලා සඳහා "ගුරු පුහුණුව" සාර්ථකව පවත්වන ලදී.

- වෙළෙඳපොළ අවශ්‍යතා සපුරාලීමට හැකි වන පරිදි අධ්‍යයන පාඨමාලාවන්හි විෂය නිර්දේශ සහ අතුරු ව්‍යවස්ථා සමාලෝචනය කරන ලද අතර කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සභාව සියලුම සංශෝධනයන් අනුමත කරන ලදී. ඒවා පහත පරිදි වේ.
  - සංචාරක, ව්‍යාපාර සිදුවීම් සහ සත්කාර කළමනාකරණ විධායක ඩිප්ලෝමාව
  - උපදේශන මනෝවිද්‍යාව උසස් ඩිප්ලෝමාව
  - උපදේශන මනෝවිද්‍යාව ඩිප්ලෝමාව
  - මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ ඩිප්ලෝමාව (Diploma in Drug Abuse Management)

පහත පශ්චාත් උපාධි පාඨමාලා ප්‍රතිව්‍යුහගත කරන ලදී.
- මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව
- ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව
- සේවා කළමනාකරණ විද්‍යාපති උපාධි පාඨමාලාව

- දමිළ භාෂා පාඨමාලාවේ මූලික සහ උසස් මට්ටම්වල පාඨමාලා විෂයමාලා සංශෝධනය කර පාඨ ග්‍රන්ථ ප්‍රකාශයට පත් කරන ලදී.

- ඉංග්‍රීසි භාෂා පාඨමාලාවේ මූලික සහ උසස් මට්ටම්වල පාඨමාලා විෂයමාලා සංශෝධනය කර පාඨ ග්‍රන්ථ ප්‍රකාශයට පත් කරන ලදී.

- ඉගෙනුම්-ඉගැන්වීමේ තක්සේරු කිරීමේ (TLAS), අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල (ILO) ඇගයුම් ඉලක්කවලට (ATS) අනුකූලවන පරිදි විෂය මාලා පෙළගැස්වීම.

## 2.2.2. පරිපාලනමය ළඟා කර ගැනීම්

- මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ජාත්‍යන්තර සබඳතා ඒකකයක් පිහිටුවන ලදී. මැලේසියාවේ මලායා විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමේ කටයුතු සිදු කරගෙන යනු ලැබේ.

- පර්යේෂණාත්මක ඉගෙනුම් සඳහා උත්ප්‍රේරකයක් (A catalyst for experimental learning) යන ශිෂ්‍ය හුවමාරු වැඩසටහන දියත් කරන ලදී.

- සියලුම සේවා කාණ්ඩ සඳහා බඳවා ගැනීම. 2018 වර්ෂයේ දී පහත කාණ්ඩවල සේවකයන් බඳවා ගන්නා ලදී.

• කථිකාචාර්ය (ආධුනික)
• නියෝජ්‍ය ලේඛකාධිකාරී - 01
• කළමනාකරණ සහකාර - 02
• කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) - 01 (මාරුවීම්)
• රියදුරු II ශ්‍රේණිය - 01

2018 වර්ෂයේදී කාර්ය මණ්ඩලයේ සේවා ගුණත්වය වැඩි දියුණු කිරීමේ අරමුණින් පුහුණු හා සංවර්ධන වැඩසටහන් (වැඩමුළු) 07ක් සාර්ථකව අවසන් කරන ලදී. මෙයට අමතරව අධ්‍යයන, පරිපාලන, සහ ලිපිකරු කාර්ය මණ්ඩල තෝරාගත් සේවකයන් වෘත්තිය සංවර්ධනය සඳහා වූ විවිධ වැඩමුළු 13ක් සඳහා සහභාගී වන ලදී.

## 2.2.3. භෞතික පහසුකම් ළඟා කර ගැනීම්

- 2018 වර්ෂය තුළ දී මානව සම්පත් අභිවර්ධන ආයතනය එහි භෞතික යටිතල පහසුකම්වල 90% ක ප්‍රගතියක් අත්පත් කර ගැනීමට සමත් විය. 2018 වර්ෂය තුළ පාලන හා මූල්‍ය අංශයන් ගොඩනැගිල්ලේ අලුතින් ඉදි කළ කොටසෙහි ප්‍රතිස්ථාපනගත කරන ලදී.

- නවීනතම පරිගණක උපාංගයන්ගෙන් යුක්තව නවීකරණය කරන ලද පරිගණක විද්‍යාගාරය 2018 වර්ෂයේ දී පිහිටුවන ලදී.

- නවීනතම වීඩියෝ පටිගත කිරීමේ උපකරණයන්ගෙන් යුක්ත ආයතන ශ්‍රවණාගාරය නවීකරණය කිරීම 2018 වර්ෂයේ දී සිදු කරන ලදී.

- මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ප්‍රතිව්‍යුහගත කරන ලද අංශවලට නව ලී බඩු සහ වෙනත් අත්‍යාවශ්‍ය පහසුකම් සපයන ලදී.

## 2.4. ශිෂ්‍ය නිපුණතා සංවර්ධනය

**කළමනාකරණ සහ මධ්‍ය-මට්ටම් කළමනාකරණය**

- 2018 වර්ෂයේ දී වියට්නාම් විශ්වවිද්‍යාලයේ සහයෝගීත්වයෙන්, මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ව්‍යාපාර කළමනාකරණ සහ මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි විද්‍යාර්ථීන් සඳහා ජාත්‍යන්තර වැඩමුළුවක් සාර්ථක ලෙස පවත්වන ලදී. වැඩමුළුවේ ඉලක්කය වූයේ වියට්නාමයේ "බහුජාතික සමාගම්වල ව්‍යාපාර උපායමාර්ග" පිළිබඳ විද්‍යාර්ථීන්ගේ දැනුම වර්ධනය කිරීමයි. මෙම වැඩසටහන සඳහා සිසුන් 86දෙනෙක් සහභාගී වූහ.

- මානව සම්පත් අභිවර්ධන ආයතනය මඟින් පවත්වනු ලබන කළමනාකරණ සහ මධ්‍ය-මට්ටම් කළමනාකරණ පාඨමාලා හදාරන සිසු සිසුවියන් සඳහා වැඩමුළු 05ක් ආයතනය විසින් සාර්ථකව සම්පූර්ණ කරන ලදී. වැඩමුළු සඳහා සහභාගී වූ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 303ක් විය. මෙම වැඩසටහන් සඳහා ඉලක්කය වූයේ සිසු සිසුවියන්ගේ උසස් අධ්‍යාපනය හා අදාළ මාතෘකා සම්බන්ධයෙන් ඔවුන්ගේ මෘදු කුසලතා සංවර්ධනය කිරීමයි.

- උපදේශනය හා මනෝවිද්‍යාව උසස් ඩිප්ලෝමා/ ඩිප්ලෝමා හදාරන සිසුන් සඳහා ක්ෂේත්‍ර චාරිකා 02ක් පැවැත්වීමට මානව සම්පත් අභිවර්ධන ආයතනයට හැකි විය. ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සිසු සිසුවියන්ට ඔවුන්ගේ ප්‍රායෝගික දැනුම වර්ධනය කර ගැනීමෙහි ලා මහෝපකාරී වූ මෙම වැඩසටහන් සඳහා සහභාගී වූ මුළු සිසු සිසුවියන් සංඛ්‍යාව 96කි.

ප්‍රථම උපාධි මට්ටම
2018 වර්ෂයේදී ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව හදාරන සිසුන් සඳහා සමස්තයක් ලෙස වැඩමුළු 04ක් (නේවාසික වැඩමුළු 02ක් හා එක් දින වැඩමුළු 02ක් ඇතුළත්ව) සාර්ථකව පවත්වන ලදී .

මෙම වැඩමුළුවල අරමුණ වූයේ ප්‍රථම උපාධි අපේක්ෂකයන්ගේ පර්යේෂණ සඳහා මාර්ගෝපදේශනය සහ සහාය දැක්වීමත් සහ ඔවුන්ගේ ඉදිරිපත් කිරීමේ කුසලතා වැඩි දියුණු කිරීමත්ය. වැඩමුළු සඳහා සහභාගී වූ මුළු සිසු සිසුවියන් සංඛ්‍යාව 714කි.

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලා වැඩමුළු විස්තර

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලා සඳහා "spss" (111 කොටස) තෙදින වැඩමුළුව සඳහා සිසු සිසුවියෝ 111ක් සහභාගී වූහ.

"මිශ්‍ර ඉගෙනුම් ගවේෂණය, සංවර්ධනය හා උපයෝජනය කිරීමේ (Exploration "Development and Implementation of Blended Learning) වැඩමුළුව සඳහා සිසු සිසුවියෝ 200ක් සහභාගී වූහ.

කළමනාකරණ ඉදිරිපත් කිරීමේ මූලධර්ම (Fundamentals of Management Presentation) පිළිබඳ දෙදින නේවාසික වැඩමුළුව සඳහා සිසු සිසුවියෝ 203ක් සහභාගී වූහ.

මිශ්‍ර ඉගෙනුම් උපයෝජනය " Implementation of Blended Learning" වැඩමුළුව සඳහා සිසු සිසුවියෝ 200ක් සහභාගී වූහ

## 2.5. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ශිෂ්‍යයන්ගේ සහ කාර්ය මණ්ඩලයේ විෂය බාහිර ක්‍රියාකාරකම් (සංවිධානය කළ සහ සහභාගී වූ)

- ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවේ දෙවන වසර සිසු සිසුවියන් විසින් සංවිධානය කරන ලද පෞරුෂ සංවර්ධනය හා සනීපාරක්ෂාව උදෙසා පැවැත්වූ "CEAT Saksham" වැඩසටහන සඳහා එම උපාධි පාඨමාලාවේ සිසු සිසුවියෝ සහභාගී වූහ.

- ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පළමු වසර සිසු සිසුවියන් විසින් ධර්ම දේශනා පිංකමක් සංවිධානය කරන ලදි.

- ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවේ පළමු වසර සිසු සිසුවියන් විසින් පැදුරු සාජ්ජය නම් සංගීත වැඩසටහනක් සංවිධානය කරන ලදි.

- මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ඉංග්‍රීසි ඒකකය විසින් 2019 ඔක්තෝබර් මස 21 දින "ඉංග්‍රීසි දිනය" වැඩසටහනක් පවත්වන ලදි.





## 2.6. මානව සම්පත් අභිවර්ධන ආයතනික සමාජ වගකීම්

**මානව සම්පත් අභිවර්ධන ආයතනය එහි සියලු මට්ටම්වල සිසු සිසුවියන් සමඟ එක්ව ආයතනික සමාජ වගකීම් (CSR) සඳහා වන ක්‍රියාකාරකම් සඳහා සහභාගී විය.**

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කාර්ය මණ්ඩලය ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවේ සිසු සිසුවියන් සමඟ එක්ව අම්පාර දීඝවාපි විද්‍යාලයේ සිසු සිසුවියන්ගේ අවශ්‍යතා උදෙසා සහාය වීමට **"සිප්සතරට අරුණැල්ලක්"**නම් වැඩසටහන සංවිධානය කරන ලදිග වැඩසටහන යටතේ පහත කර්තව්‍යයන් සපුරාලීමට ආයතනයට හැකි විය.

- පැරණි පුස්තකාලය හා ක්‍රීඩා පිටිය නවීකරණය කිරීම.
- පුස්තකාලය සඳහා පොත් පත් හා පොත් රාක්ක සැපයීම.
- සිසු සිසුවියන්ට දෛනික පාසල් වැඩකටයුතු සඳහා අවශ්‍ය වන අභ්‍යාස පොත් හා අනෙකුත් අවශ්‍යතා සපයන ලදි.

**ඇස පාදමු - ජීවිතය දෙමු**

- ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවේ සිසු සිසුවියන් 2018 සැප්තැම්බර් මස 11 දින කොළඹ විශ්වවිද්‍යාලයේ ගෘහස්ත ක්‍රීඩාගාරයේදී සෞඛ්‍ය කඳවුරක් පවත්වන ලදි. ලේ දන්දීමේ පහසුකම සහිතව විවිධ සෞඛ්‍ය පරීක්ෂාවන් සැපයීමේ අරමුණ සහිතව මෙය පොදු ජනතාවට විවෘත විය.

2018 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනය රජයේ පාසල් 07කට සහ ශ්‍රී ලංකා යුධ හමුදාවට සහ විශේෂ කාර්ය බලකායට කාර්යාල උපකරණ සහ අනෙකුත් උපකරණ පරිත්‍යාග කරන ලදි. පරිත්‍යාග කරන ලද අයිතම අතර කාර්යාලයීය උපකරණ එකසිය හතලිස් පහක් (145) ද අනෙකුත් උපකරණ පනස් හයක් ද විය. ලැයිස්තුව පහත දක්වා ඇත.

| ආයතනය | කාර්යාල උපකරණ | වෙනත් |
|---|---|---|
| අම්/ වේළුසුමන විද්‍යාලය, අම්පාර | 33 | - |
| බප/ගම්/ ගලහිටියාව මධ්‍ය විද්‍යාලය, ගනේමුල්ල | 03 | - |
| බප/කැළ/ ශ්‍රී ඥානිස්සර ද්විතියික මහා විද්‍යාලය | 42 | 2 |
| අම්/ දීඝවාපී සිංහල මහා විද්‍යාලය | 25 | - |
| කො/ රාජසිංහ මහා විද්‍යාලය දෙමටගොඩ | - | 2 |
| ශ්‍රී ලංකා යුධ හමුදාව | 11 | 52 |
| විශේෂ කාර්ය බලකාය | 31 | - |
| එකතුව | 145 | 56 |

මූලාශ්‍රය - රැස් කළ දත්ත 2018, මා.ස.අ.ආ

## 3. 2018 වර්ෂයේ සමාලෝචනය

### 3.1. අධ්‍යයන පාඨමාලා

2018 වර්ෂයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය කාණ්ඩ පහක් යටතේ අධ්‍යයන පාඨමාලා 17ක් පවත්වන ලදී.

- පශ්චාත් උපාධි පාඨමාලා
- ප්‍රථම උපාධි පාඨමාලා
- විධායක ඩිප්ලෝමා පාඨමාලා
- ඩිප්ලෝමා පාඨමාලා
- සහතිකපත්‍ර පාඨමාලා

### 3.1.1. පශ්චාත් උපාධි පාඨමාලා

2018 වර්ෂයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනය විවිධ විෂය ක්ෂේත්‍රයන්හි ඉතා වැදගත් පශ්චාත් උපාධි පාඨමාලා පහක් පිරිනමන ලදි. මෙම පාඨමාලාවල අරමුණ වන්නේ වෘත්තිකයන් ඔවුන්ගේ අදාළ විෂය ක්ෂේත්‍රයන්හි දැනුම, කුසලතා, සහ ආකල්ප වැඩි දියුණු කිරීමයි.

මානව සම්පත් අභිවර්ධන ආයතනය කළමනාකරණ විෂය ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා තුනක් පවත්වාගෙන යනු ලබයි. මෙම වැඩසටහන්, කළමනාකරුවන්ට ඔවුන්ගේ විෂය පථයන් තුළ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීම අරමුණු කොට ඇත. කළමනාකරණ වෘත්තීන්හි යෙදී සිටින සිසුන්ට සියලු කළමනාකරණ ශික්ෂණ මුඛ්‍ය දැනුම හා අවබෝධය ලබා ගත හැක. එමෙන්ම ඉතා විශ්වාසයෙන් යුතුව ව්‍යාපාරික ගැටලු හමුවේ මුහුණ දීමටත් ගැටලු විසඳීම සඳහා අවශ්‍ය සංකල්පමය සහ විශ්ලේෂණාත්මක මෙවලම් සම්පාදනය කිරීමත් මෙමගින් සිදු කෙරේ.

භූ තොරතුරු සහ ආපදා කළමනාකරණය විශ්ලේෂණ සහ පාලන යන විෂය ක්ෂේත්‍රයන්හි විද්‍යාපති පාඨමාලාවන් දෙකක් ආයතනය විසින් පවත්වාගෙන යනු ලබයි. මෙම පාඨමාලා සැලසුම් කර ඇත්තේ භූ තොරතුරු සහ ආපදා විශ්ලේෂණ, කළමනාකරණය සහ පාලනය යන විෂය ක්ෂේත්‍රයන්හි විශේෂීකරණය අවශ්‍ය විද්‍යාර්ථීන්ට එම අංශවල සම්පත් තක්සේරු කිරීම, අධීක්ෂණය, ඇගයීම සහ සම්පත් කළමනාකරණය ආදී වූ දැනුම් සංවර්ධනය ඉලක්ක කොටගෙනය.

කෙසේ වුවද, 2018 වර්ෂයේදී මානව සම්පත් අභිවර්ධන ආයතනයට පැවැත්වීමට හැකි වූයේ පශ්චාත් උපාධි පාඨමාලා හතරක් (04) ක් පමණකි. අදාළ බලධාරීන්ගේ අනුමැතිය සමඟ භූ තොරතුරු විද්‍යාපති පාඨමාලාවට හැර අනෙක් පශ්චාත් උපාධි පාඨමාලා හතර (04) සඳහා සිසුන් ඇතුලත් කරගන්නා ලදි.

වැඩිම සිසු සිසුවියන් සංඛ්‍යාවක් හදාරනු ලබන්නේ ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාවයි. විවිධ සේවා අංශවල සේවා නියුක්තියන් සේවා කළමනාකරණය පශ්චාත් උපාධිය හැදෑරීමට ලැදියාවක් දක්වන අතර එය මානව සම්පත් අභිවර්ධන ආයතනයේ දෙවන වැඩිම පශ්චාත් උපාධි ප්‍රවේශය සහිත පාඨමාලාවයි.

පශ්චාත් උපාධි පාඨමාලාවල ශිෂ්‍ය කාර්යසාධනය
2014 - 2018




| පාඨමාලාව | වාර්ෂික ඇතුලත් කරගැනීම 2014 | 2015 | 2016 | 2017 | 2018 | උපාධිලාභී 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව | 160 | 172 | 61 | 95 | 115 | 77 | 87 | 0 | 127 | 125 |
| මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව | 146 | 135 | 67 | 54 | 67 | 113 | 85 | 93 | 135 | 96 |
| සේවා කළමනාකරණ විද්‍යාපති උපාධි පාඨමාලාව | 112 | 121 | 66 | 0 | 77 | 0 | 43 | 88 | 54 | 62 |
| භූ තොරතුරු විද්‍යාපති උපාධි පාඨමාලාව | 51 | 0 | 83 | 0 | 0 | 7 | 7 | 62 | 54 | 5 |
| ආපදා විශ්ලේෂණ, කළමනාකරණය සහ පාලනය විද්‍යාපති උපාධි පාඨමාලාව | 50 | 0 | 0 | 0 | 48 | 0 | 25 | 26 | 38 | 11 |

මූලාශ්‍රය - රැස් කළ දත්ත 2018, මා.ස.අ.ආ

## 3.1.2. ප්‍රථම උපාධි පාඨමාලාව

### 3.1.2.1 ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ප්‍රධාන අභිමතාර්ථ අතරින් එකක් වනුයේ "අවශ්‍ය කරන ප්‍රමාණයෙන් සහ ගුණාත්මයෙන් මානව කුසලතා සංවර්ධනය කිරීමත් සාමූහික වරණයන් සහ ප්‍රයත්නයන් දැරීම සඳහා සේවකයන් සහ කළමනාකරුවන්ට අධ්‍යාපනය ලබාදීමත් වේ." ඒ අනුව, ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව ආරම්භ කරන ලදි.

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව, මානව සම්පත් අභිවර්ධන ආයතනය මගින් වසර 39ක් පුරා පවත්වාගෙන යනු ලබන අතර රජයේ අරමුදල්වලින් අනුග්‍රහය ලබන එකම උපාධි පාඨමාලාව වේ.

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවේ කාලය සමාසික 06කින් සමන්විත වසර තුනක කාලයකි. ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවේ කාල සීමාව වසරකි. උපාධි පාඨමාලාව සඳහා සෘජුව ලියාපදිංචි වීමට සුදුසුකම් නොලබන අපේක්ෂකයන්ට වසරක ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ඉඩ ලබා දෙනු ලැබේ. ඇතුළත් වීමේ නිර්ණායක මෙම පාඨමාලා දෙකම සඳහා තෝරා ගැනීමේ පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් යන දෙකම අදාළ වේ.

2018 වර්ෂයේදී, අපේක්ෂකයන් 575 ක් තෝරා ගැනීමේ පරීක්ෂණය සඳහා අයදුම් කරන ලද අතර සියලු අපේක්ෂකයන් අතුරින් පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගනු ලැබුවේ එම අපේක්ෂකයන්ගෙන් 38% ක ප්‍රමාණයකි. ඉන් ප්‍රථම උපාධි අයදුම්කරුවන් දෙසිය විසි එක් දෙනෙක් (221) පාඨමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි වූහ.

පාඨමාලා සමාරම්භක උත්සවය 2018 අගෝස්තු පළමුවන දින කොළඹ විශ්ව විද්‍යාලයීය නව කලාගාරයේදී පැවැත්විණි. 2018 වර්ෂය තුළ මෙම පාඨමාලාවේ විවිධ මට්ටම්වල ලියාපදිංචි වූ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 522කි. 2014 සිට පසුගිය වර්ෂ 05 ක කාලයේ විශ්ලේෂණය අනුව උපාධිධාරී නිමැවුමේ සමස්ත සාමාන්‍යය 2018 වර්ෂයේ දී 69.6% ක් ලෙස පෙන්නුම් කෙරේ.




| පාඨමාලාව | වාර්ෂික ඇතුලත් කර ගැනීම | | | | | උපාධිලාභී | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2014 | 2015 | 2016 | 2017 |
| අධ්‍යාපනවේදී උපාධි | 206 | 157 | 194 | 184 | 221 | 153 | 119 | 124 | 137 |
| අධ්‍යාපන ඩිප්ලෝමා | 59 | 51 | 54 | 48 | 66 | 37 | 42 | 32 | 30 |

මූලාශ්‍රය - රැස් කළ දත්ත 2018, මා.ස.අ.ආ

### 3.1.3. විධායක ඩිප්ලෝමා පාඨමාලා

විධායක ඩිප්ලෝමා පාඨමාලාව අදාළ වැඩ ක්ෂේත්‍රයේ නියැලී සිටින වෘත්තිකයින් සඳහා විෂය ප්‍රාගුණ්‍ය සුදුසුකම් ලබා ගැනීමට ඉතාමත් සුදුසු වේ. මෙම වැඩසටහන්හි ප්‍රධාන පරමාර්ථය වන්නේ කළමනාකරුවන්ට වැඩ කිරීමේදී පවරා ඇති ක්ෂේත්‍රයන්හි ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කිරීමට සහ යාවත්කාලීන කිරීමට අවස්ථා සැලසීමයි. මෙම පාඨමාලා සැලසුම් කර ඇත්තේ දැනුම වැඩි දියුණු කළ යුතු මධ්‍යම මට්ටමේ විධායකයින් සඳහාය.

එමෙන්ම, විධායක ඩිප්ලෝමා පාඨමාලාවන් පුද්ගල සංවර්ධනය කේන්ද්‍ර කොටගෙන ඇත්තේ සහභාගිවන්නන් ඔවුන්ගේ ගනුදෙනුකරුවන් සමඟ කටයුතු කිරීමේදී පදනමක් ලෙස තම හැසිරීම් රටාවන් අභියෝගයට ලක් කිරීමේ පෞද්ගලික අත්දැකීමක් ඔවුන්ට අත්‍යාවශ්‍යවන බවට තිබෙන ස්ථිරසාර විශ්වාසය මත පදනම්වය.

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පාඨමාලා විධිමත් කිරීමේ අරමුණින් සියලුම විධායක ඩිප්ලෝමා පාඨමාලා තාවකාලිකව අත්හිටුවන ලදි. 2015 සහ 2016 වර්ෂවල ආරම්භ කරන ලද පාඨමාලා පමණක් 2017 දක්වා පවත්වාගෙන යන ලදි.

2018 වර්ෂයේදී උපදේශන මනෝවිද්‍යාව උසස් ඩිප්ලෝමා පාඨමාලාව සිසු සිසුවියන් 48 දෙනෙකගේ සහභාගිත්වයෙන් ආරම්භ කරන ලදි.

විධායක ඩිප්ලෝමා පාඨමාලාවන්හි ශිෂ්‍ය කාර්යසාධනය
2014-2018




| පාඨමාලාව | වාර්ෂික ඇතුළත් කර ගැනීම | | | | | සුදුසුකම් ලබා ගත් සිසුන් ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
| මානව සම්පත් කළමනාකරණ විධායක ඩිප්ලෝමාව | 97 | 113 | 35 | 0 | 0 | 34 | 61 | 81 | 0 | 35 |
| * ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ විධායක ඩිප්ලෝමාව | 0 | 31 | 0 | 0 | 0 | 0 | 13 | 0 | 17 | 0 |
| ආපදා විශ්ලේෂණය කළමනාකරණය පිළිබඳ විධායක ඩිප්ලෝමාව | 43 | 0 | 0 | 0 | 0 | 25 | 0 | 23 | 0 | 0 |
| * සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමාව | 83 | 94 | 107 | 0 | 0 | 50 | 59 | 51 | 0 | 115 |
| සංචාරක සිදුවීම් සහ සත්කාර කළමනාකරණය පිළිබඳ විධායක ඩිප්ලෝමාව | 0 | 35 | 0 | 0 | 0 | 0 | 0 | 34 | 0 | 0 |
| උපදේශන මනෝවිද්‍යාව උසස් ඩිප්ලෝමාව | 0 | 0 | 0 | 0 | 48 | 0 | 0 | 0 | 0 | 0 |

මූලාශ්‍රය - රැස් කළ දත්ත 2018, මා.ස.අ.ආ

* තාවකාලිකව අත්හිටවනු ලදී

### 3.1.4. ඩිප්ලෝමා පාඨමාලා

මානව සම්පත් අභිවර්ධන ආයතනය මගින් පිරිනමනු ලබන ඩිප්ලෝමා වර්ග 03කි. ඒවා කළමනාකරණ, මානව ශාස්ත්‍ර සහ භාෂා පාඨමාලාවලින් සමන්විත වේ. මෙම පාඨමාලා මූලික මට්ටමේ රැකියා නියුක්තිකයන්ට තමන්ගේ අදාළ ක්ෂේත්‍රය තුළ දැනුම, විශ්ලේෂණාත්මක චින්තනය, හැකියාවන් ගොඩනැගීම, සදාචාරාත්මක ප්‍රමිතීන්, නායකත්වය සහ වගකීම් දැරීම දියුණු කිරීම සඳහා සහාය වීමට සැලසුම් කර ඇත. සිසුන්ට ඔවුන්ගේ විවිධ අවශ්‍යතාවන් සපුරා ගැනීමට මෙම ඩිප්ලෝමා පාඨමාලා මහෝපකාරී වේ. ඇතැම් අවස්ථාවල දී ඒවා අධ්‍යාපන කටයුතුවල විවිධ අවධීන් අතර ඇති පරතරය පුරවාලීම සඳහා හෝ අමතර වෘත්තීය පුහුණුවක් සහ සුදුසුකම් සැපයීම සඳහා උපකාරී වේ. තවද ඩිප්ලෝමා පාඨමාලාවක් මගින් වැදගත් විශේෂිත කුසලතා, දැනුම සහ අත්දැකීම් සම්පාදනය කරයි.

අධ්‍යයන පාඨමාලා විධිමත් කිරීම පිණිස වසර තුළ දී බාහිර පාර්ශවයන් පවත්වාගෙන යනු ලැබූ ඇතැම් සහයෝගාත්මක වැඩසටහන් අත්හිටුවන ලදි. මේ හේතුවෙන් ඩිප්ලෝමා පාඨමාලා හතරක් සඳහා සිසු සිසුවියන් ඇතුළත් කර නොගන්නා ලදි. 2019 වර්ෂයේ දී මෙම පාඨමාලා නැවත ආරම්භ කිරීමට ක්‍රියා කරමින් සිටියි.

කෙසේ වුවද, 2017 වර්ෂය හා සසඳන කළ ඩිප්ලෝමා පාඨමාලා 02ක් සඳහා සිසුන් ඇතුළත් කරනු ලැබීය. ඒවා නම් අතිරේක භාෂාවක් ලෙස දමිළ භාෂා ඩිප්ලෝමාව සහ උපදේශන මනෝවිද්‍යාව ඩිප්ලෝමාව වේ. එය 2018 වර්ෂයේ දී 69% ක වර්ධනයකි.

ඩිප්ලෝමා පාඨමාලාවන්හි ශිෂ්‍ය කාර්යසාධනය
2014-2018



| පාඨමාලාව | වාර්ෂික ඇතුළත් කර ගැනීම | | | | | සුදුසුකම් ලබා ගත් සිසුන් ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
| * සේවා කළමනාකරණ විධායක ඩිප්ලෝමාව | 74 | 58 | 20 | 0 | 0 | 64 | 23 | 37 | 0 | 27 |
| මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණය ඩිප්ලෝමාව | 0 | 50 | 0 | 0 | 0 | 25 | 0 | 0 | 0 | 27 |
| උපදේශන මනෝවිද්‍යාව ඩිප්ලෝමාව | 50 | 34 | 0 | 0 | 48 | 25 | 36 | 23 | 55 | 29 |
| අතිරේක භාෂාවක් ලෙස දමිළ භාෂා ඩිප්ලෝමාව | 120 | 163 | 124 | 96 | 90 | 0 | 124 | 123 | 100 | 74 |
| * කළමනාකරණ ඩිප්ලෝමාව | 0 | 22 | 34 | 0 | 0 | 0 | 11 | 10 | 0 | 27 |

මූලාශ්‍රය - රැස් කළ දත්ත 2018, මා.ස.අ.ආ

* තාවකාලිකව අත්හිටවනු ලදී

### 3.1.5. සහතිකපත් පාඨමාලා

මානව සම්පත් අභිවර්ධන ආයතනය වෘත්තිමය සංවර්ධනයක් කරා අධ්‍යයනයේ නියුතු සිසු සිසුවියන් සඳහා විවිධ විෂය ක්ෂේත්‍රයන්හි සහතිකපත් පාඨමාලා පිරිනමනු ලබයි. 2018 වර්ෂයේ දී සහතිකපත් පාඨමාලා අටක් (08) ක් පවත්වනු ලැබීය. මානව සම්පත් අභිවර්ධන ආයතනය ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව වසර 30කට අධික කාලයක් පුරා පිරිනමා ඇත. විවිධ මට්ටම් සඳහා ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලා පහ (05)ක් පවත්වාගෙන යයි.




| පාඨමාලාව | වාර්ෂික ඇතුළත් කර ගැනීම | | | | | සුදුසුකම් ලබා ගත් සිසුන් ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
| ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව | 2206 | 2149 | 1321 | 1321 | 2283 | 1665 | 1688 | 0 | 986 | 1523 |
| ඉංග්‍රීසි භාෂා පදනම් පාඨමාලාව | 259 | 187 | 217 | 0 | 413 | 132 | 120 | 0 | 143 | 269 |
| ගුරුවරුන් සඳහා ඉංග්‍රීසි භාෂා සහතිකපත් පාඨමාලාව | 99 | 99 | 67 | 0 | 48 | 67 | 62 | 0 | 55 | 25 |
| කථන ඉංග්‍රීසි සහතිකපත් පාඨමාලාව | 1707 | 1705 | 3637 | 1933 | 580 | 544 | 1261 | 2706 | 1471 | 0 |
| පාසල් හැරයන්නන් ඉංග්‍රීසි භාෂා කෙටිකාලීන පාඨමාලාව | 215 | 251 | 130 | 54 | 342 | 45 | 314 | 0 | 45 | 101 |
| පරිගණක යෙදවුම් සහතිකපත් පාඨමාලාව | 549 | 354 | 452 | 0 | 412 | 213 | 246 | 320 | 336 | 275 |
| දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - මූලික | 658 | 316 | 341 | 405 | 327 | 0 | 411 | 242 | 203 | 0 |
| දමිළ භාෂා සහතිකපත් පාඨමාලාව - අන්තර්මධ්‍යම | 322 | 262 | 160 | 145 | 157 | 0 | 200 | 159 | 109 | 104 |

මූලාශ්‍රය - රැස් කළ දත්ත 2018, මා.ස.අ.ආ

## 3.2. 2018 වර්ෂයේ පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු

මානව සම්පත් අභිවර්ධන ආයතනය තුළ, පශ්චාත් උපාධි, උපාධි සහ ඩිප්ලෝමා හදාරන සිසු සිසුවියන් ඔවුන් අදාළ අධ්‍යයන පාඨමාලාවේ අනිවාර්ය අංගයක් ලෙස වැඩමුළුවකට සහභාගී විය යුතුය. මෙම පාඨමාලාවල අරමුණ සිසු සිසුවියන්ගේ වෘත්තීය සංවර්ධනයයි. දේශන මෙන් නොව, වැඩමුළු මගින් වෘත්තීය ලෝකයට අවශ්‍ය මාතෘකා පිළිබඳ විවෘතව සාකච්ඡා කිරීමට සහ නව අදහස් ඉදිරිපත් කිරීමට සංවාදාත්මක සාකච්ඡා සඳහා දිරි ගන්වනු ලබයි. සහභාගීවන්නන්ට ගැටලු හමුවේ මුහුණ දීමේ දී ගැටලු නිරාකරණයට ඔවුන්ගේ දෘෂ්ටිය අනුව ගැටලු විසඳා ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ අදහස් හුවමාරු කර ගත හැක. නව කුසලතා දියුණු කර ගැනීමට වැඩමුළු උපකාරී වන අතර එය සිසු සිසුවියන්ගේ ප්‍රගතිය කෙරෙහි උපකාරී වේ. සිසු සිසුවියන්ට ඔවුන්ගේ ඉදිරිපත් කිරීමේ, නායකත්වයේ, සන්නිවේදනයේ, කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ කුසලතා වැඩි දියුණු කර ගත හැකිය.

මෙම වැඩසටහන්වල අරමුණ වූයේ සන්නිවේදනයෙන් ආරම්භ කොට විවිධ පරිසරවල සේවය කිරීම, චිත්තවේගීය සංවේදීතාව සංවර්ධනය කිරීම, නිර්මාණශීලී සහ අවධි තීරණ ඉගෙනුම, සමඟ වැඩ කරන්නේ කෙසේද යන්න පිළිබඳ දැනුවත්බව, සහ මහජනයා සමඟ සාකච්ඡා කිරීම දියුණු කිරීම, ඔවුන් තුළම හා අන්‍යයන්ගේ ඇතිවන ආතතිය සහ ගැටුම් දුරලීම වැනි පුළුල් පරාසයක පැතිර ඇති මෘදු කුසලතා සංවර්ධනය කිරීමයි.

2018 වර්ෂය තුළ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ පාඨමාලා හදාරන සිසු සිසුවියන්ගේ, රාජ්‍ය/පෞද්ගලික අංශවල සේවා නියුක්තිකයන්ගේ දැනුම, කුසලතා, ආකල්ප, වැඩි දියුණු කිරීමේ අරමුණින් පශ්චාත් උපාධි, ප්‍රථම උපාධි, සහ ඩිප්ලෝමා පාඨමාලාවල ලියාපදිංචිව සිටින එම සිසුනට පුහුණු පාඨමාලා 13ක් (ජාත්‍යන්තර වැඩමුළු ද ඇතුළත්ව) පවත්වන ලදි.

| පාඨමාලාව | මාතෘකාව | සහභාගී වූ සංඛ්‍යාව | දිනය / දින |
|---|---|---|---|
| සේවා කළමනාකරණ විද්‍යාපති උපාධිය | SPSS Workshop | 64 | 2018 ජනවාරි 6 සහ 13 |
| මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධිය | උපායමාර්ගික කළමනාකරණය | 53 | 2018 මැයි 13 සහ 14 |
| ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය | workshop on "Exploration. Development & Implementation of Blended Learning" | 222 | 2018 මැයි 30 |
| භූ විද්‍යා තොරතුරු විද්‍යාපති උපාධිය | Arial Mapping Survey | 68 | 2018 ජුනි 3 සහ 4 |
| සේවා කළමනාකරණ විද්‍යාපති උපාධිය | Customer Leadership Management | 45 | 2018 ජූලි 28 සහ 29 |
| ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය | workshop on "Implementation of Blended Learning" programme | 222 | 2018 සැප්තැම්බර් 4 |
| ජාත්‍යන්තර වැඩමුළුව - වියට්නාමය (ව්‍යා.කළ පශ්චාත් උපාධිය/ මා.සම්.කළ පශ්චාත් උපාධි) | Business Strategy of Multinational Companies (MNCs) in Vietnam | 86 | 2018 ඔක්තෝබර් 1 සිට 3 දක්වා |
| ඉංග්‍රීසි පාඨමාලා | ඉංග්‍රීසි දිනය | 500 | 2018 ඔක්තෝබර් 21 |
| සේවා කළමනාකරණ විද්‍යාපති උපාධිය | සේවා කළමනාකරණ භාවිතයන් | 73 | 2018 නොවැම්බර් 23 සහ 24 |
| ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය | “කළමනාකරණයේ මූලධර්ම” වැඩමුළුව | 203 | 2018 නොවැම්බර් 25 සහ 26 |
| ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය | SPSS Session | 111 | 2018 දෙසැම්බර් 3,5 සහ 6 |
| උපදේශනය ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා | මානසික සෞඛ්‍යය පිළිබඳ ජාතික ආයතනයට අධ්‍යයන ක්ෂේත්‍ර චාරිකාව | 96 | 2018 දෙසැම්බර් 29 |
| උපදේශනය ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා | කොළඹ 07 වික්ටෝරියා උද්‍යානයට අධ්‍යයන ක්ෂේත්‍ර චාරිකාව | 96 | 2018 දෙසැම්බර් 29 |

මූලාශ්‍රය - රැස් කළ දත්ත 2018, මා.ස.අ.ආ

## 3.2.1. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව

| වැඩසටහන | සහභාගී වූ අයගේ නම/ වෘත්තිමය තත්වය | දිනය | ස්ථානය |
|---|---|---|---|
| ආයතනයේ සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීම පිළිබඳ වැඩමුළුව 2018-2022 | සියලුම කාර්ය මණ්ඩලය | 2018 ජනවාරි 5 | රේණුකා හෝටලය |
| ආයතනයේ සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීම පිළිබඳ වැඩමුළුව 2018-2022 | සියලුම කාර්ය මණ්ඩලය | 2018 ජනවාරි 20 | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි පර්යේෂණ හා පුහුණු ආයතනය |
| ආයතනයේ උපායමාර්ගික සැලැස්ම දැනුවත් කිරීම පිදිබඳ කණ්ඩායම් ඉදිරිපත් කිරීම II | සියලුම කාර්ය මණ්ඩලය | 2018 පෙබරවාරි 12, 14, 16, 20, 21 සහ 22 | මානව සම්පත් අභිවර්ධන ආයතන ශ්‍රවණාගාරය |
| මානව සම්පත් අභිවර්ධන ආයතනයේ සුහද හමුව 2018 | සියලුම කාර්ය මණ්ඩලය | 2018 මැයි 09 | ශ්‍රී ලංකා පදනම් ආයතනය |
| ශාස්ත්‍රීය සංවර්ධන ගවේෂණය, මිශ්‍ර ඉගෙනුම් සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩමුළුව | මානව සම්පත් අභිවර්ධන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්, බාහිර කථිකාචාර්යවරුන් | 2018 මැයි 30 | Hilton Colombo Residences |
| ක්‍රියාකාරී සැලැස්ම ප්‍රගති සමාලෝචන සාකච්ඡාව | සියලුම කාර්ය මණ්ඩලය | 2018 ජූනි 11, 13, සහ 14 | මානව සම්පත් අභිවර්ධන ආයතන ශ්‍රවණාගාරය |
| Workshop on maintaining PPE (SLAS 7 & 8) | ටී.බී.ටී.එස් විජේසිංහ මහතා | 2018 ජූලි 17 | නිපුණතා සංවර්ධන අරමුදල |
| ලිපිකරු කුසලතා වැඩමුළුව | ආර්.එම්.ඩබ්.එම් කරුණාරත්න මහතා සහ එච්.පී.බී.එල්. පතිරණ මිය | 2018 ජූලි 23,24 සහ 25 | නිපුණතා සංවර්ධන අරමුදල |
| Office Package and Application session | සියලුම කාර්ය මණ්ඩලය | 2018 ජූලි 18 සහ 26<br>2018 අගෝස්තු 2 සහ 16 | මානව සම්පත් අභිවර්ධන පරිගණක විද්‍යාගාරය |
| ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගති සමාලෝචන ඉදිරිපත් කිරීම පිළිබඳ සාකච්ඡාව 2018 | සියලුම කාර්ය මණ්ඩලය | 2018 අගෝස්තු 7 | මානව සම්පත් අභිවර්ධන ආයතන ශ්‍රවණාගාරය |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය වැඩමුළුව | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී සහ සහකාර මූල්‍යාධිකාරී | 2018 අගෝස්තු 2 සහ 3 | නිපුණතා සංවර්ධන අරමුදල |
| රාජ්‍ය ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | ඩී.එස්.මුරගේ මිය, ටී.ජේ.ටී.එස් විජේසිංහ මහතා, සහ අයි.එම්.ඩී.සී.කේ ඉලංගකෝන් මහතා | 2018 ජූලි 20 සහ 26, 2018 අගෝස්තු 3,9 සහ 17 | රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය |
| Session for Implementation of BTL | ශ්‍රම අධ්‍යාපනවේදී පාඨමාලාවේ අධ්‍යයන කාර්ය මණ්ඩලය | 2015 සැප්තැම්බර් 4 | මානව සම්පත් අභිවර්ධන ආයතන පරිගණක විද්‍යාගාරය |
| Workshop on e-Government cyber security and social media for Information Professionals | ආර්.එම්.එස්.එන් රත්නායක මිය | 2018 ඔක්තෝබර් 16 | ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලය |
| නව විගණන පනත පිළිබඳ වැඩමුළුව | ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | 2018 ඔක්තෝබර් 25 සහ 26 | නිපුණතා සංවර්ධන අරමුදල |
| 44 වන ජාත්‍යන්තර ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය ශාස්ත්‍රීය සංවර්ධනය පිළිබඳ ලිපි ඉදිරිපත් කිරීම | ආචාර්ය ඩබ්.එස්. චන්ද්‍රසේකර | | |
| ශාස්ත්‍රීය සංවර්ධනය පිළිබඳ ලිපි ඉදිරිපත් කිරීම | කේ.ඒ.ඒ.එන් තිලකරත්න මහතා | 2018 නොවැම්බර් 16 සහ 17 | කොළඹ විශ්වවිද්‍යාලය |
| ශාස්ත්‍රීය සංවර්ධනය පිළිබඳ ලිපි ඉදිරිපත් කිරීම සමාජ විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය | කේ.ඒ.ඒ.එන් තිලකරත්න මහතා | 2018 දෙසැම්බර් 13 සහ 14 | කැලණිය විශ්වවිද්‍යාලය |
| මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සම්මන්ත්‍රණය | ඩී.ජී.සී.එන් බණ්ඩාර මහතා, කේ.එල්.ඩී.ජී රිච්ඩ්මන් මහතා | 2018 දෙසැම්බර් 18 | ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය |
| ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගති සමාලෝචන ඉදිරිපත් කිරීම 2018 | එක් එක් ඒකකයේ/ ශාඛාවේ/ මධ්‍යස්ථානයේ/ කුටියේ ප්‍රධානී | 2018 දෙසැම්බර් 10 | මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ශ්‍රවනාගාරය |

මූලාශ්‍රය - රැස් කළ දත්ත 2018, මා.ස.අ.ආ

## 3.3. පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

| පර්යේෂකයාගේ නම | මාතෘකාව | ප්‍රකාශිත දිනය | ස්ථානය/ ප්‍රකාශනය |
|---|---|---|---|
| මහාචාර්ය ජේ.ඒ.එස්.කේ ජයකොඩි<br>ඩබ්.බී.එම්.ඩී බස්නායක මිය | The effect of Theme Knowledge Management Practises on Theme Performance; The Moderating Effect of Transformational Leadership and Team Cohensiveness | 2018 | කළමනාකරණ ශ්‍රී ලංකා ජර්නලය |
දශක හතරකට ආසන්න දිගු ඉතිහාසයකට උරුමකම් කියන මානව සම්පත් අභිවර්ධන ආයතනය, 1979 අංක 11 නියමාවලිය මගින් සේවක අධ්‍යාපන ආයතනය නමින් ස්ථාපිත කරන ලද අතර එය වර්ෂ 2006 අංක 01 නියමාවලිය මගින් සංශෝධනය කරනු ලැබිණ. 2006 වසරේදී සේවක අධ්‍යාපන ආයතනය මානව සම්පත් අභිවර්ධන ආයතනය ලෙස නම් කරන ලදී. මානව සම්පත් අභිවර්ධන ආයතනය රටේ පැරණිතම විශ්වවිද්‍යාලය වන කොළඹ විශ්වවිද්‍යාලයට අයත් අධ්‍යයනායතනයකි. කොළඹ විශ්වවිද්‍යාලයීය අධ්‍යයන ආයතනයක් වීම තුළ ආයතනයේ අධ්‍යයන කටයුතු කොළඹ විශ්වවිද්‍යාලයේ දැඩි අධීක්ෂණයට ලක්වේ. ඕනෑම උසස් අධ්‍යාපන ආයතනයක් පවත්වා ගත යුතු අධ්‍යයන කටයුතුවල උසස් ප්‍රමිතීන් පවත්වා ගැනීම සහ යහපත් සම්ප්‍රදායන් ඉදිරියටත් පවත්වාගෙන යාම සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය බැඳී සිටී.

රාජ්‍ය විශ්වවිද්‍යාල අධ්‍යයනායතනයක් ලෙස මානව සම්පත් අභිවර්ධන ආයතනයද 2018 - 2022 කාල පරාසය සඳහා ආයතන සංයුක්ත සැලැස්ම සැකසීමේ සිට ක්‍රියාකාරී සැලැස්මයන් තුළින් අපේක්ෂිත අරමුණු ඉලක්ක කරා ගමන් කිරීමේදී සෑම රාජ්‍ය ආයතනයක් මෙන්ම එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය අනුව, තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම වෙනුවෙන් ආයතනික අරමුණු සහ ඉලක්ක කේන්ද්‍රගත කොට ඇති බව සතුටින් දැනුම් දීමට කැමැත්තෙමු.

මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2018 - 2022 යන පස් වසරක කාලය සඳහා ආයතන සංයුක්ත සැලැස්ම සකස් කිරීමේදී අධ්‍යාපන ආයතනයක් ලෙස ප්‍රධාන වශයෙන් තිරසර සංවර්ධන අරමුණුවලින් අපේක්ෂා කෙරෙන ගුණාත්මක අධ්‍යාපනය, පරිසරය සුරැකීම සහ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව යන අංගයන් වෙත අපගේ මූලික අවධානය යොමු කොට ඇත.

ඒ අනුව පසුගිය 2018 වසර තුළ ආයතන ක්‍රියාකාරී සැලැස්ම මගින් බලාත්මක කෙරුණු පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම් සහ පරිසරයට යම් සෘණාත්මක බලපෑමක් සිදුවන්නේ නම් එය අවම කර ගැනීම පිළිබඳ විස්තර සහ අවශ්‍ය අවස්ථාවලදී, පාරිසරික සහ ආපදා බලපෑම් ඇගයීම් ඇතුළත් විය හැකි තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව මෙසේ එළි දක්වමු.

**2. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2018 - 2022 කාල පරාසය සඳහා වූ සංයුක්ත සැලැස්මට අනුව ආයතනික අරමුණු**

- අරමුණ 01 - උසස් අධ්‍යාපනයට සමාන ප්‍රවේශයක් සහ පුළුල් සහභාගිත්වය
- අරමුණ 02 - අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ අදාළත්වය වැඩි දියුණු කිරීම
- අරමුණ 03 - පර්යේෂණ, නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය ශක්තිමත් කිරීම
- අරමුණ 04 - සමාජ ආර්ථික සංවර්ධනයේදී උපාය මාර්ගික හවුල්කාරිත්වය වැඩි කිරීම
- අරමුණ 05 - ජාත්‍යන්තර සහයෝගීතාව සහ තරගකාරිත්වය වැඩි කිරීම
- අරමුණ 06 - භෞතික හා සෞන්දර්ය පරිසරය වැඩි දියුණු කිරීම තුළින් පාර්ශවකරුවන්ගේ සංතෘප්තිය
- අරමුණ 07 - පරිපාලන පද්ධතිය සහ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම
- අරමුණ 08 - මූල්‍ය කළමනාකරණය සහ තිරසාරබව වැඩි දියුණු කිරීම
- අරමුණ 09 - යහපාලනය පුළුල් කිරීම

2018 වසර තුළ ආයතන ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු ත්‍රිත්වයක උපාය මාර්ග තුළින් පරිසරය ආරක්ෂා කර ගැනීම, සහ පරිසරයට යම් සෘණාත්මක බලපෑමක් සිදුවන්නේ නම් එය අවම කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමු කොට ඇති අරමුණු වන්නේ,

- අරමුණ 03 - පර්යේෂණ, නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය ශක්තිමත් කිරීම
- අරමුණ 06 - භෞතික හා සෞන්දර්ය පරිසරය වැඩි දියුණු කිරීම තුළින්

පාර්ශවකරුවන්ගේ සංතෘප්තිය

- අරමුණ 07 - පරිපාලන පද්ධතිය සහ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම

**3. පර්යේෂණ, නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය ශක්තිමත් කිරීම**

පර්යේෂණ, නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය ශක්තිමත් කිරීමේ ඉලක්කය සපුරා ගැනීම සඳහා විද්වතුන් සහ සිසුන් තුළ පර්යේෂණ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සහ පර්යේෂණ සහ සංවර්ධනය වෙනුවෙන් යටිතල පහසුකම් සංවර්ධනය යන අරමුණු ද්විත්වය ක්‍රියාකාරකම් 11ක් ඔස්සේ සාක්ශාත් කර ගැනීමට කටයුතු සැලසුම් කෙරිණ. මෙහි ප්‍රධාන වශයෙන් සංවර්ධනය වෙනුවෙන් යටිතල පහසුකම් සංවර්ධනය යන අරමුණ ළඟා කර ගැනීමේදී තිරසර සංවර්ධන ඉලක්කවලට අනුව පරිසරයට විය හැකි සෘණාත්මක බලපෑම අවම කර ගැනීමට සහ සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාව සහ පිරිසිදු හා පාරිසරික වශයෙන් හොඳ තාක්ෂණයන් භාවිත කිරීමට පහත උපාය මාර්ග ත්‍රිත්වය ක්‍රියාවට නංවන ලදී.

- පර්යේෂණ නිබන්ධ සඳහා විද්‍යුත් ගබඩාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම
- පුස්තකාල සේවා ලබා දීමේදී විද්‍යුත් ගබඩාකරණය සහ විද්‍යුත් පහසුකම් භාවිතය වැඩි දියුණු කිරීම
- පුස්තකාල ස්වයංක්‍රීයකරණය

2017 වසරේ සිට ආරම්භ කරන ලද මෙම ක්‍රියාවලිය මගින් ආයතන පුස්තකාලයේ ඉඩපහසුකම් වැඩි කර ගැනීම, පුස්තකාල පහසුකම් සලසා දීමේදී කාර්යක්ෂම මෙන්ම ගුණාත්මකභාවයෙන් ඉහළ සේවාවක් ලබා දීම, නවීන පහසුකම් භාවිතයට ශිෂ්‍යන් යොමු කරවීම තුළින් අනාගත පරපුර වෙනුවෙන් තිරසර සේවාවක් පුස්තකාල සේවා පහසුකම් සම්පාදනයේදී ලබා දීමට මේවන විට ආයතනයට හැකිව තිබේ.

ග්‍රන්ථ 20,000කට අධික සංඛ්‍යාවක් පැවති මානව සම්පත් අභිවර්ධන පුස්තකාලයේ පැරණි පොත්-පත්, සඟරා, සහ පර්යේෂණ නිබන්ධ ආදිය විද්‍යුත් ගබඩාකරණ ක්‍රියාවලියට යොමු කරවීම හේතුවෙන් ආයතන පරිශ්‍රයෙන් ඉවත් කරවීමට හැකි වූ අතර භාවිතයට ගත හැකි පොත්-පත් රාශියක් ශ්‍රී ලංකාවේ පාසල්, අධ්‍යාපන ආයතනවල ඉල්ලීම් මත නැවත භාවිතය වෙනුවෙන් ලබා දීමට ආයතනයට හැකි විය. තවද ආයතන පරිශ්‍රයේ භාවිතයෙන් ඉවත් කරන ලද පුස්තකාල ශෘහභාණ්ඩ රාශියක්ද උක්ත ක්‍රමවේදයට භාවිත කොට නැවත භාවිතයට ලබා දීමට කටයුතු කිරීමට හැකි විය. මේ වන විට මෙම වැඩසටහනේ වැඩකටයුතු 80%ක් පමණ සම්පූර්ණ කොට ඇති බව සතුටින් දැක්විය හැක.

**4. භෞතික හා සෞන්දර්ය පරිසරය වැඩි දියුණු කිරීම තුළින් පාර්ශවකරුවන්ගේ සංතෘප්තිය**

භෞතික හා සෞන්දර්ය පරිසරය වැඩි දියුණු කිරීම තුළින් පාර්ශවකරුවන්ගේ සංතෘප්තිය ඇති කිරීම උදෙසා ආයතනය විසින් 2018 වසරේදී ක්‍රියාමාර්ග රාශියක් අනුගමනය කිරීමට පියවර ගෙන ඇත. ඒ අතර 2018 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් පහත උපාය මාර්ගයන් වැදගත් වේ.

- පවත්නා ගොනැගිලි පහසුකම් පුළුල් කිරීම
- පරිසර හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම
- සෞඛ්‍ය-සනීපාරක්ෂණ තත්ත්වයන් වැඩි දියුණු කිරීම

2018 වසරේදී මානව සම්පත් අභිවර්ධන ආයතන පරිශ්‍රයට නව දිගුවක් ලෙසින් ආයතන ඒකක පහසුකම් වැඩි දියුණු කිරීමේ සහ ආයතන සංවිධානාත්මක ව්‍යුහය ප්‍රතිසැලසුම් කිරීමකට ලක් කිරීමට කටයුතු කෙරිණ. මෙහි ප්‍රතිඵලයන් ලෙස ආයතන භූමියෙන් විශාල භාණ්ඩ ප්‍රමාණයක් නැවත භාවිතයට ගත හැකි වන ලෙසින් ආයතන සංග්‍රහයට අනුව අනුමැතිය ලත පාර්ශව වෙත මුදා හැරීමට කටයුතු කිරීමට හැකිවිය. නිසි පරිදි ආයතන භූමියෙන් ඉවත් කිරීම නිසා පරිසරයට විය හැකිව තිබූ හානිය ඉතාමත් අවම කර ගැනීමට ආයතනයට හැකිවිය.

පරිසර හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා ආයතන විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග අතර, ආයතන පරිශ්‍රය තුළ ප්ලාස්ටික් සහ පොලිතින් භාවිතය අවම කිරීමට පියවර ගැනීම, මෙහිදී ආහාර රැගෙන ඒමේදී පොලිතින් කවර වෙනුවට ආහාර බඳුන් රැගෙන ඒමට ආයතනික ශ්‍රමික ප්‍රජාව දිගින් දිගටම දැනුවත් කරන ලද අතර එහි වඩාත් ප්‍රායෝගික උත්සාහයක් ලෙස ආයතන සේවක සුභසාදක සංගමයේ දායකත්වයෙන් සෑම සේවකයෙක්ම සඳහාම දිවා ආහාර බඳුනක් නොමිලයේ ලබා දීමට කටයුතු කෙරිණ.

තවද දේශකවරුන් සඳහා මෙතෙක් භාවිත කිරීමට යෙදුනු ප්ලාස්ටික් බෝතල් භාවිතය වෙනුවට දිගුකලක් භාවිත කල හැකි ජල බෝතල් භාවිතයට කටයුතු සම්පාදනය කෙරිණ.

ආයතනය තුළ මුද්‍රන කටයුතුවලදි සිදුවන හානිය අවම කර ගැනීම සඳහා ඒවා පාලනය කිරීමට ස්වයං පාලන දිරිගැන්වීම් මෙන්ම මහා පරිමාණ මුද්‍රන කටයුතුවලදී ඒවා විධායක කාර්ය මණ්ඩලයේ නියාමනයට යටත්ව සිදු කිරීමට පියවර ගැනීම. මෙතෙක් පැවති විදුලි පරිහරණ පද්ධතිය පිළිසකර කරමින් සහ ආයතනයට විදුලි බුබුළු, වායුසමීකරණ යන්ත්‍ර ආදිය මිලදී ගැනීමේදී විදුලිය පිරිමැසෙන විද්‍යුත් උපාංගයන් මිලදී ගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීම. ආයතනය තුළ විදුලි පරිභෝජනය අවම කිරීම වෙනුවෙන් ආයතන ප්‍රජාව දැනුවත් කිරීම මෙන්ම ඔවුන් ඒ සඳහා දිරිගැන්වීමට කටයුතු කෙරිණ.

පානීය ජල නාස්තිය අවම කර ගැනීම සඳහා පිරිපහදු කරන ලද පානීය ජල බඳුන් භාවිතයට කටයුතු කළ අතර නිසි පරිදි ජල භාවිතයට සේවක ප්‍රජාව දිරිමත් කිරීමට කටයුතු කිරීම ආදිය වැදගත් වේ.

සෞඛ්‍ය-සනීපාරක්ෂණ තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා ආයතනය විසින් අනුගමනය කළ පියවර අතර සේවක ප්‍රජාව සහ ආයතනය තුළ අධ්‍යයන කටයුතුවල නියුක්ත වන ශිෂ්‍යයන්ට භාවිත කිරීමට පිරිසිදු පානීය ජලය ලබා දීමට කටයුතු කිරීම එක් වැදගත් ක්‍රියාමාර්ගයකි.

ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේදී ආයතනයේ භාවිතයට වැසිකිළි පද්ධතියක් සකස් කරන ලදී. නවීන මාදාලියේ උපාංගයන්ගෙන් යුක්තව නිම කරන ලද මෙම වැසිකිළි පද්ධතිය හේතුවෙන් ආයතන සේවකයන්ගේ සනීපාරක්ෂණ ගුණාත්මකභාවය උසස් කිරීමට හැකියාව ලැබුණු අතර එමගින් කාර්යක්ෂම සේවාවාවක් මෙන්ම සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට මෙම පහසුකම පිටිවහලක් විය. සනීපාරක්ෂාව තවදුරටත් වැඩි දියුණු කරමින් අත් පිස්නා, අත්සේදුම් දියර ආදී අංගයන්ගේද පහසුකම් ලබා දීමට කටයුතු කෙරෙමින් පවතී.

සෞඛ්‍ය හා සනීපාරක්ෂාව තවදුරටත් තහවුරු කරමින් ආයතන අපද්‍රව්‍ය බැහැර කිරීමේදී ඒවා නිසි පරිදි වෙන්කොට පරිසරය වෙත මුදා හැරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව දිරන, නොදිරන ලෙස වෙන් කොට කසළ ඉවත් කිරීමට ආයතන ශ්‍රමික ප්‍රජාව දැනුවත් කර ඇත.

**5. පරිපාලන පද්ධතිය සහ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම**

තිරසර සංවර්දනය වෙනුවෙන් ආයතනික පරිපාලන පද්ධතිය සහ එහි ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට කටයුතු ආරම්භ කෙරිණ. ඒ අනුව ආයතනික පරිපාලන, විභාග, ශිෂ්‍ය ඉගෙනුම් කළමනාකරණ පද්ධති උපයෝජනයට කටයුතු සැලසුම් කරන ලද අතර මේ වන විට ශිෂ්‍ය ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය සාර්ථකව භාවිතයට ගැනෙන අතර පරිපාලන සහ විභාග කළමනාකරණ පද්ධති භාවිතයට ගැනීමට කටයුතු සකස් කරමින් පවති. මෙම පද්ධති මගින් ආයතනය තුළ කොල භාවිතය අවම කර ගත හැකි අතර කාර්යාල ඉඩපහසුකම් කළමනාකරණයටද එය ඉතා වැදගත් වේ.

**6. සමාලෝචනය**

සමස්තයක් ලෙස ආයතනයේ සංයුක්ත සැලැස්මෙහි ඇති ඉලක්කයන් ගුණාත්මක අධ්‍යාපනයක් මගින් ශ්‍රී ලංකාවේ 'දැනුම්-ආර්ථිකය' සඳහා බලපෑමක් ඇති කළ හැකි දායකත්වයක් දැක්වීමට ඉහළ පෙළේ මිනිස් සම්පත් සමූහයක් ලෙස 'දැනුම්-සේවා-කාණ්ඩ' උත්පාදනය කිරීම පදනම් කොට ගෙන ඇත. තිරසර සංවර්ධන ඉලක්කයන්හි ප්‍රධාන ඉලක්කයක් වන සැමට ගුණත්වයෙන් යුත් අධ්‍යාපනයක් ලබා දීමේ වගකීම ඉතාමත් මැනෙවින් ආයතන සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරි සැලැස්ම තුළින් ක්‍රමික වර්ධනයෙන් යුතුව ඉදිරියට ගෙන යාමට හැකි සියලුම ක්‍රියාමාර්ගයන් ගැනීමට ආයතනය යුහුසුළුව කටයුතු කරමින් සිටී. එම ඉලක්කයන් සාක්ශාත් කර ගැනීමට යන ගමන්මග තුළ රටට හිතැති අධ්‍යාපන ආයතනයක් ලෙස 2018 වසරේ සිට මේ දක්වා පරිසරය ආරක්ෂා කර ගැනීම සහ පරිසරයට විය හැකි සෘණාත්මක බලපෑම් පිළිබඳ විස්තර සහ අවශ්‍ය අවස්ථාවලදී, පාරිසරික සහ ආපදා බලපෑම් ඇගයීම් ඇතුළත්ව මෙම තිරසර සංවර්ධනය මත පදනම් වූ මෙම වාර්තාව මෙසේ ඉදිරිපත් කිරීමට කටයුතු කෙරිණ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එච්ආර්ඩී/බී/අයිඑච්ආර්ඒ / 6/18/03 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2019 ජූනි 08 දින

අධ්‍යක්ෂ
මානව සම්පත් අභිවර්ධන ආයතනය

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය යන මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

## 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.5,460,216ක් වූ දේපල පිරියත උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව මෙම ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ කාරක ප්‍රාග්ධන වෙනස්වීම යටතේ දැක්විය යුතු විවිධ ගෙවිය යුතු වටිනාකම රු. 444,647 ක් විය යුතු වුවත් එම අගය රු.554, 581 ක් ලෙස රු 109,934 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ලෙජර් ගිණුම් අනුව ස්ථාවර වත්කම් මිලදී ගැනීම් ලෙස එකතුව රු.35,515,936 ක් වූ වටිනාකම වෙනුවට මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වත්කම් එකතු කිරීමේ මුදල් ගලායාම ලෙස රු. 37,693,250 ගැනීමෙන් රු.2, 177,314 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) පෙර වර්ෂයේදී වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් වැය කරන ලද සහ මෙම වර්ෂයේ මුදල් ප්‍රවාහයට අදාළ නොවන රු.6,303,980 ක් සමාලෝචිත වර්ෂය තුළ "වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන" ගිණුමෙන්, "වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන" ගිණුමට මාරු කර තිබුණි. මෙම ගනුදෙනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යැමක් ලෙස දක්වා තිබුණි.

(ඉ) 2015 වර්ෂයට පෙර ආයතනය උපයා තිබූ අරමුදලින් රු.44,772,390 ක් වටිනා වත්කම් මිලදී ගෙන තිබුණි. එම වටිනාකම ප්‍රාග්ධන ප්‍රධාන ගිණුමේ දිගින් දිගටම ඉදිරියට ගෙනවිත් තිබූ අතර එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද 2015 වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබුණු රු.5,795,000 ක් වූ මෝටර් රථයේ වටිනාකමට සමාන අගයක බැර ශේෂය කාලීනව ආදායමට ගෙන නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල වූ රු.1,005,302 ක් වටිනා වියදම් මූල්‍ය ප්‍රකාශනවල උපචිත වියදම් ලෙස හඳුනාගත යුතු වුවත් එසේ නොකිරීමෙන් එම අගයෙන් වියදම් අඩුවෙන් දක්වා තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(උ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට තොග සමීක්ෂණ වාර්තාව අනුව තොගවල වටිනාකම රු.1,507,015 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන වල එම අගය රු.1,530,156 ක් වූයෙන් රු.23,141 ක වෙනසක් පැවතුණි.

(ඌ) ප්‍රාග්ධන ප්‍රදාන ලෙජර ගිණුමේ ආරම්භක ශේෂය රු.85,052,490 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.84,784,426 ක් ලෙස දැක්වීමෙන් රු.268,064 ක වෙනසක් පැවතුණි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතිවලට සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

**2.1** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

**2.2** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| <u>නීතිරීති / විධානයට යොමුව</u> | <u>විස්තරය</u> |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i. මුදල් රෙගුලාසි 371 හා 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරනරාජ්‍ය මුදල් චක්‍රලේඛය | අත්තිකාරමක් ලබාදීම හුදෙක් මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් සීමා විය යුතු වුවත් මාණ්ඩලික නොවන නිලධාරීන් 14 දෙනෙකු වෙත අවස්ථා 121 කදී එකතු වටිනාකම රු.3,807,567 ක අත්තිකාරම් මුදලක් ලබාදී තිබුණි. |
| ii. මුදල් රෙගුලාසි 387 | ආයතනය විසින් ගෙවීම් සඳහා තම බැංකු ශේෂය ප්‍රමාණවත් දැයි සලකා බලා ගෙවීම් සිදුකල යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසන් දිනට ජංගම ගිණුම් 02 ක රු. 1,677,647 ක් වටිනා අයිරාවක් පවතින බව නිරීක්ෂණය විය. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | | |
|---|---|---|
| (ආ) | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය IX පරිච්ඡේදය | අතිකාල සඳහා පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් රු.209,379 ක් වටිනා අතිකාල සඳහා එසේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. ආයතන සංග්‍රහය අනුව තවද ගෙවිය යුතු අතිකාල රේටය මාසික ඒකාබද්ධ වැටුප මත තීරණය විය යුතු වුවද ඊට පටහැනිව දෛනික පදනම හා අතිකාල රාජකාරී කරන පැය ගණන පදනම් කර ගනිමින් තවත් රේටයක් මතද අතිකාල ගෙවීම් කර තිබුණි. |
| (ඇ) | 2004 ජුලි 29 දිනැති පීඊඩී/25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවති රු.178,503,752 ක ස්ථාවර තැන්පතු ආයෝජනය කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඈ) | ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අංක පුස/01 හා 2004 ජනවාරි 26 දිනැති චක්‍රලේඛය | 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.4,107,082 ක් වටිනා පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඉ) | 2014 ඔක්තෝම්බර් 17 දිනැති අංක 2/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සෑම මුදල් වර්ෂයකම ජනවාරි 15 දිනට පෙර භෞතික භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර මාර්තු 17 වන දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට පිටපතක් සහිතව විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. |
| (ඊ) | 1995 ජුලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | විභාගය පැවැත්වූ දින සිට මාස 03 ක කාලයක් ඇතුළත විභාග ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවත් ආයතනය විසින් 2017 සහ 2018 වර්ෂයන්හි පවත්වන ලද විභාග 04 ක ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස 07 ත් මාස 10 ත් අතර කාලයක් ගත කර තිබුණි. |

**2.3** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

**2.4** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඖ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඊ) වගන්තියට පටහැනිව ප්‍රසම්පාදන සැලැස්ම ඉටු කර තිබූ කාර්යයන්ට ගැලපෙන පරිදි වර්ෂය අවසානයේදී සංශෝධනය කර තිබුණි.

(ආ) තෝරාගත් සැපයුම්කරුවන්ගෙන් කොන්ත්‍රාත් වටිනාකමින් 10% ක කාර්යසාධන සුරක්ෂිතයක් ලබාගත යුතු බවට ගිවිසුම් වල ඇතුළත් කර තිබුණද නියැදි පරීක්ෂාවේදී සැපයුම්කරුවන් දෙදෙනෙකුගෙන් වටිනාකම රු.940,00 ක් සඳහා එවැනි කාර්යසාධන සුරක්ෂිත ලබාගෙන නොතිබුණි.

## 3. වෙනත් නිරීක්ෂණ

(අ) 2018 – 2022 ආවරණය වන සේ ආයතනයේ අරමුණු 09 ක් ඉටුකරගැනීමට අදාලව සකස් කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූල වන සේ ක්‍රියාකාරී සැලැස්ම සකස් විය යුතු වුවද සංයුක්ත සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම් හා එහි ප්‍රතිඵල මැනීම සඳහා යොදා ගන්නා කාර්යසාධන දර්ශක 2018 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් වී නොතිබූ බැවින් එම දර්ශක පදනම් කරගනිමින් කාර්යසාධනය මැනීමට නොහැකිවී තිබුණි.

(ආ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු සංඛ්‍යාව 98 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 54 ක් වීමෙන් පුරප්පාඩු 44 ක් විය. අනුමත කාර්ය මණ්ඩල තනතුරු වල පුරප්පාඩු සඳහා බඳවා ගැනීමකින් තොරව අනධ්‍යාන කාර්යය මණ්ඩලය සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 17 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළ සේවක වැටුප් ලෙස රු.7,543,227 ක් ගෙවා තිබුණි.

(ඇ) අයවැය සංඛ්‍යා තත්‍ය සංඛ්‍යා සමග සැසඳීමේදී ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම වෙනුවෙන් අයවැය ගත වියදම ඉක්මවා තත්‍ය වියදම සියයට 654 කින් වැඩි වී තිබූ අතර, නඩත්තු වියදම අයවැයගත වියදම ඉක්මවා සියයට 50 කින් වැඩි වී තිබුණි. ඒ අනුව ආයතනයේ අයවැය තාත්වික අයුරින් සකස් කර ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NAOSL NATIONAL AUDIT OFFICE

(ඈ) අත්තිකාරම් මුදලින් අවස්ථා 27 කදී ලබාගත් වටිනාකම රු.580,655 ක්වූ අත්තිකාරම් දින 28 සිට 185 ක් දක්වා ද තවත් රු.206,650 ක්වූ අත්තිකාරම් 03 ක් දින 50 සිට 268 දක්වා වූ කාල පරාසයක් ප්‍රමාද වී තිබුණි. තවද රු.100,000 ක සීමාව ඉක්මවා පුද්ගලයින් 04 දෙනෙකුට අවස්ථා 12කදී රු.3,864,025ක අත්තිකාරම් ලබා දී තිබුණි.

(ඉ) ආයතනයේ ගනුදෙනු සඳහා බැංකු ජංගම ගිණුම් 07 ක් පවත්වාගෙන යන අතර එහි වර්ෂය අවසානයට ශුද්ධ ශේෂය රු.42,600,104 ක් විය. එම ශේෂ මුදල් පොත අනුව සෘණ රු.1,251,321 සිට රු. 37,406,915 ක ධන ශේෂය දක්වා වූ පරාසයක් තුල පැවතුණි. එම ජංගම ගිණුම්වල විශාල වශයෙන් මුදල් රැස් කිරීම මූල්‍ය කළමනාකරණයේ දුර්වලතාවයක් ලෙස නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

| මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම | | | | විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු | ඉදිරිපත් කරන පිළිතුරු | 2018 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්ත්වය හා සංවර්ධනය |
|---|---|---|---|---|---|---|
| 1. | 1.2 | (අ) | මූල්‍ය ප්‍රකාශන තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.5,460,216 ක් වූ දේපල පිරියත උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව මෙම ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂය අවසන් විමට පෙර ඵලදායී ජීවිත කාලය ඇස්තමේන්තු කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ඉවත් කල යුතු භාණ්ඩ ඉවත් කල පසු ඉතිරි භාණ්ඩ වල ඵලදායි ජීවිත කාලය ඇස්තමේන්තු කිරිමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත. |
| | | (ආ) | | මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ කාරක ප්‍රාග්ධන වෙනස්වීම යටතේ දැක්විය යුතු විවිධ ගෙවිය යුතු වටිනාකම රු.444,647 ක් විය යුතු වුවත් එම අගය රු.554,581 ක් ලෙස රු. 109,934 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මීළඟ ගිණුම් වර්ෂයේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | එම |
| | | (ඇ) | | ලේජර් ගිණුම් අනුව ස්ථාවර වත්කම් මිලදී ගැනිම් ලෙස එකතුව රු.35,515,936 ක් වූ වටිනාකම වෙනුවට මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වත්කම් එකතු කිරිමේ මුදල් ගලායාම ලෙස රු.37,693,250 ගැනීමෙන් රු.2,177,314 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ස්ථාවර වත්කම් මිලදී ගැනීමට අදාලව නිවැරදි වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සහ ලෙජර් ගිණුම් වල දක්වා ඇත. | එම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | (ඈ) | | පෙර වර්ෂයේදී වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් වැය කරන ලද සහ මෙම වර්ෂයේ මුදල් ප්‍රවාහයට අදාළ නොවන රු. 6,303,980 ක් සමාලෝචිත වර්ෂය තුළ වැය නොකළ ප්‍රග්ධන ප්‍රදාන ගිණුමෙන් වැය කළ ප්‍රග්ධන ප්‍රදාන ගිණුමට මාරු කර තිබුණි. මෙම ගනුදෙනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා යෑමක් ලෙස දක්වා තිබුණි. | වැය නොකළ ප්‍රාග්ධන ගිණුමට අදාල ශේෂය පෙර වර්ෂයට අදාලව ලැබුණු ප්‍රාග්ධන අරමුදල්වලින් සමන්විත වී ඇති අතර එම අරමුදල් මේ වන තෙක් භාවිතා කර නොතිබිණි. එම අරමුදල් මෙම වර්ෂය තුළ අදාල ප්‍රාග්ධන වියදම් පියවා ගැනීමට යොදා ගෙන ඇති නිසා එය මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල මුදල් ගලා යාමක් ලෙස පෙන්වා ඇත. | එම |
| | | (ඉ) | | 2015 වර්ෂයට පෙර ආයතනය උපයා තිබූ අරමුදලින් රු.44,772,390 ක් වටිනා වත්කම් මිලදී ගෙන තිබුණි. එම වටිනාකම ප්‍රාග්ධන ප්‍රධාන ගිණුමේ දිගින් දිගටම ඉදිරියට ගෙනවිත් තිබූ අතර එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.තවද 2015 වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබුණු රු. 5,795,000 ක් වූ මෝටර් රථයේ වටිනාකමට සමාන අගයක බැර ශේෂය කාලීනව ආදායමට ගෙන නොතිබුණි. | 2015 වර්ෂයට පෙර වත්කම් මිලදී ගැනීම පාඨමාලා අරමුදල් තුලින් සෘජුවම සිදු කර එය ප්‍රාග්ධන ගලා යෑම් ලෙස හඳුනා ගැනීමෙන් මෙම ශේෂයන් නිරූපණය වී ඇත. මෙම ප්‍රාග්ධන වියදම් ප්‍රාග්ධන ගිණුමට මාරු කිරීමට මීළඟ ගිණුම් වර්ෂයේදී කටයුතු කරනු ලැබේ. මෝටර් රථයට අදාල පරිත්‍යාග අගය මීළඟ ගිණුම් වර්ෂයේදී ආදායමට හඳුනා ගැනීමට කටයුතු කරනු ලැබේ. | අදාල ප්‍රාග්ධන වියදම් හඳුනා ගෙන ක්‍රමක්ෂය කිරීමට අවශ්‍ය කටයුතු මීලඟ ගිණුම් වර්ෂයේදී සිදු කරනු ලැබේ. |
| | | (ඊ) | | සමාලෝචිත වර්ෂයට අදාල වූ රු.1,005,302 ක් වටිනා වියදම් මූල්‍ය ප්‍රකාශනවල උපචිත වියදම් ලෙස හඳුනාගත යුතු වුවත් එසේ නොකිරීමෙන් එම අගයෙන් වියදම් අඩුවෙන් දක්වා තිබුණි. | සඳහන් කර ඇති උපචිත වියදම් විභාග කටයුතු සහ දේශන වලට අදාලව ගෙවිය යුතු වියදම් වේ. මෙම වියදම් කලින් හඳුනාගෙන ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම් ගත කිරීම දුෂ්කර කටයුත්තකි. මීළඟ ගිණුම් වර්ෂයේදී අදාල වියදම් සඳහා වෙන් කිරීම් කර මෙම අඩුපාඩුව නිවැරදි කරගැනීමට කටයුතු කරමි. | එම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | (ඇ) | | සමාලෝචිත වර්ෂය අවසන් දිනට තොග සමීක්ෂණ වාර්තාව අනුව තොගවල වටිනාකම රු.1,507,015 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එම අගය රු.1,530,156 ක් වුයෙන් රු. 23,141 ක වෙනසක් පැවතුණි. | භාණ්ඩ ලැබීම් පත්‍රිකා 2 කට අදාලව ගෙවීම් සිදු කර නොමැති නිසා මෙම වෙනස ඇති වී ඇත. මෙම ණය ණයහිමියන් යටතේ ඇතුලත් කර ගිණුම් වලට ගෙන ඇත. | නිවැරදි කර ඇත. |
| | | (ඈ) | | ප්‍රාග්ධන ප්‍රදාන ලෙජර ගිණුමේ ආරම්භක ශේෂය රු.85,052,490 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.84,784,426 ක් ලෙස දැක්විමෙන් රු.268,064 ක වෙනසක් පැවතුණි. | ප්‍රාග්ධන ප්‍රධාන ගිණුමේ රු. 134,032 ක හර ශේෂයක් තිබීම 2017 ගිණුම් විගණනයේදී විගණන විමසුම් තුලින් පෙන්වා දී තිබීම නිසා එය නිවැරදි කිරීමට එම ශේෂය සංවර්ධන අරමුදලට මාරු කිරීම නිසා මෙම වෙනස ඇති වී තිබේ.(ඇමුණුම5-6) | එම |
| 2 | 2. 2 | (අ) | **<u>නීතිරීති/විධානයට යොමුව</u>**<br>ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>i මුදල් රෙගුලාසි 371 හා ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අත්තිකාරම් ලබාදීම හුදෙක් මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් සීමා විය යුතු වුවත් මාණ්ඩලික නොවන නිලධාරීන් 14 දෙනෙකු වෙත අවස්ථා 121 කදී එකතු වටිනාකම රු.3,807,567 ක අත්තිකාරම් මුදලක් ලබාදී තිබුණි. | මාණ්ඩලික නොවන නිලධාරීන් සඳහා අත්තිකාරම් ලබා දීම මේ වන විට සම්පූර්ණයෙන්ම නවත්වා ඇති අතර මාණ්ඩලික නිලධාරීන්ට පමණක් අත්තිකාරම් ලබා දීම සිදු කරයි. | එම |
| | | | ii.මුදල් රෙගුලාසි 387 | ආයතනය විසින් ගෙවීම් සඳහා තම බැංකු ශේෂය ප්‍රමාණවත් දැයි සලකා බලා ගෙවීම් සිදුකල යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසන් දිනට ජංගම ගිණුම් 02 ක රු. 1,677,647 ක් වටිනා අයිරාවක් පවතින බව නිරික්ෂණය විය. | මෙම වර්ෂය තුලදී ආයතනයේ ගිණුම් තැබීම තවදුරටත් ක්‍රමවත් කිරීම සඳහා මහජන බැංකුව සමඟ රැස්කිරීමේ ගිණුමක් හරහා පාඨමාලාවන්ට අදාලව ගාස්තු අය කිරීම සිදු කරන ලදී. එම නිසා ආයතනයේ ආදායම එම රැස්කිරීමේ ගිණුම තුලින් අදාල බැංකු ගිණුම් වලට මාරු කරගත යුතුය. මුල් අවස්ථාවන්හිදී එම මාරු කිරීම බැංකු ප්‍රකාශය පසුව සිදු කිරීම නිසා මුදල් පොතේ බැංකු ශේෂය සෘණ අගයක් ගෙන තිබුණද කිසිම විටක බැංකු ගිණුමේ ශේෂය සෘණ අගයක් ගෙන නොමැත. මේ වන විට අන්තර්ජාලය (online) හරහා අදාල ගිණුම් වලට මාරු කිරීම සිදු කරයි. | එම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | (ආ) | විශ්ව විද්‍යාල ආයතන සංග්‍රහය ix පරිච්ඡේදය | අතිකාල සඳහා පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් රු.209,379 ක් වටිනා අතිකාල සඳහා එසේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.ආයතන සංග්‍රහය අනුව තවද ගෙවිය යුතු අතිකාල රේටය මාසික ඒකාබද්ධ වැටුප මත තීරණය විය යුතු වුවද ඊට පටහැනිව දෛනික පදනම හා අතිකාල රාජකාරි කරන පැය ගණන පදනම් කර ගනිමින් තවත් රේටයක් මතද අතිකාල ගෙවීම් කර තිබුණි. | • මින් ඉදිරියට අතිකාල සම්බන්ධව පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් පසුව පමණක් ගෙවීමට කටයුතු කරන ලෙසට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.<br>• එසේම අතිකාල සේවයේ නියුතුවන්නන් හටද පූර්ව අනුමැතිය ලබාගත යුතු බව දැනටමත් දන්වා ඇත.<br>• 2015.10.29 දින පැවැති 46 වන මූල්‍ය කමිටුව මඟින් ආයතනය විසින් පවත්වන විවිධ පාඨමාලා සඳහා සහභාගි වන කාර්ය මණ්ඩල සාමාජිකයන් හට අතිකාල ගෙවීම් සම්බන්ධව නිශ්චිත වූ රේටයන් තීරණය කර ඇත.<br>• මෙසේ කිරීමට හේතුව වන්නේ මෙම ගෙවීම් සිදුවන්නේ අදාළ පාඨමාලාවලින් ලැබෙන ආදායම් තුළින් බැවිනි.<br>• එබැවින් සේවකයින් සතිඅන්ත නිවාඩු දිනවල සහ සතියේ දිනවල රාජකාරි වේලාවෙන් බැහැරව සිදු කරනු ලබන අතිකාල සේවා, ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා තුලින් ලැබෙන අදායමින් කලින් නිශ්චය කළ රේටයන් තුළ සිදු කරනු ලබයි .<br>• මූල්‍ය කමිටුවේ මෙම තීරණය 2015 නොවැම්බර් 12 වන දින පැවති 362 අධ්‍යන සභාව මඟින් අනුමත කර ඇත. | අතිකාල සම්බන්ධ පූර්ව අනුමැතිය ලබා ගැනිමෙන් පසුව පමණක් ගෙවිම සිදු කරයි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | (ඇ) | 2004 ජූලි 29 දිනැති පීඊඩී/25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවති රු.178,503,752 ක ස්ථාවර තැන්පතු ආයෝජනය කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | රු.138,412,500 කට අදාල ස්ථාවර තැන්පතු සඳහා භාණ්ඩාගාර අනුමැතිය දැනටමත් ලබාගෙන ඇති අතර ඉතිරි තැන්පතු සඳහාද භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | එම |
| | | (ඈ) | ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අංක පුස/01 හා 2004 ජනවාරි 26 දිනැති චක්‍රලේඛය | 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.4,107,082 ක් වටිනා පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | 2016 වර්ෂයේ අවසන් වරට පුස්තකාල පොත් සමීක්ෂණයක් පවත්වා වාර්තාව අධ්‍යක්ෂ මගින් මුදල් අංශය වෙත ඉදිරිපත් කර ඇත.<br><br>2017 නොවැම්බර් මස පුස්තකාල පොත් අධ්‍යාපන පීඨ ගොඩනැගිල්ලේ සිට මා.ස.අ.ආ. කාර්යාල ගොඩනැගිල්ල වෙත ගෙන ඒමෙන් පසු පොත් සමීක්ෂණයක් කිරීමට මූලික කටයුතු ආරම්භ කරනු ලැබුවත් එම ගෙන එන ලද පොත් ද කොටසක් නැවත ඉවත් කිරීමට කටයුතු කිරීමට සිදු වූ හෙයින් පොත් සමීක්ෂණ කටයුතු අතර මග දී අත්හිටුවීමට සිදු විය.<br><br>නොකඩවා පොත් අපහරණ කටයුතු සිදු කිරීම නිසා ඊට පසු පොත් සමීක්ෂණයක් කළ නොහැකි වූ අතර 2019 ජූනි මස පොත් සමීක්ෂණයක් කිරීමට සැලසුම් කර ඇත. | 2019 වර්ෂය සඳහා පුස්තකාල පොත් සමීක්ෂණයෙ සිදුකර ඇත. |
| | | (ඉ) | 2014 ඔක්තෝම්බර් 17 දිනැති අංක 2/2014 දරන රාජ්‍ය මුදල් චක්රලේඛය | සෑම මුදල් වර්ෂයකම ජනවාරි 15 දිනට පෙර භෞතික භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර මාර්තු 17 වන දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට පිටපතක් සහිතව විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. | 2018 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකිරිමට පෙර ආයතනය සතු ස්ථාවර වත්කම් හඳුනා ගැනීම සම්බන්ධයෙන් නව අංකන ක්‍රමයක් (Coding System) හඳුන්වා දෙන ලදි. එසේම එම ස්ථාවර වත්කම් පරිඝණක ගත කිරිම ද සිදු විය. එසේ කිරිමෙන් පසු 2018 වර්ෂයෙන් භාණ්ඩ සමීක්ෂණය 2019 ජනවාරි 10,11 දින කණ්ඩායම් 4ක් මගින් සිදු කරන ලදි.<br><br>ස්ථාවර වත්කම් ඛණ්ඩ 10 ක් යටතේ වර්ගීකරණය (Categorization) කර තිබූ අතර අංකනය සිදු කිරිමේදි සමහර භාණ්ඩ (වත්කම්) වැරදි ලෙස අංකනය සිදුකර තිබුණි. එම වත්කම් නැවතත් නිවැරදි වර්ගීකරණයටත් අංකනය | උක්ත වාර්තාවන් විගණකාධිපතිතුමා වෙත ඉදිරිපත් කර ඇත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | . | | | කෙරුණි. මෙම ක්‍රියාවලියෙන් පසුව සියලුම ස්ථාවර වත්කම් සහ තොග පරිගණක ගත කිරීම නැවතත් සිදු කරන ලදි.<br><br>මෙම නිවැරදි කිරිමේ ක්‍රියාවලියෙන් පසුව දෙවන වරට නැවතත් භාණ්ඩ සමික්ෂණය 2019 මාර්තු 29 දින සිදු කල අතර ඒ සම්බන්ධ වාර්තාව අධ්‍යක්ෂ තුමා වෙත භාර දෙන ලද අතර එය අධ්‍යයන සභාවට ඉදිරිපත් කරන ලදි. | |
| | | (ඊ) | 1995 ජුලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | විභාගය පැවැත්වූ දින සිට මාස 03 ක කාලයක් ඇතුළත විභාග ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවත් ආයතනය විසින් 2017 සහ 2018 වර්ෂයන්හි පවත්වන ලද විභාග 04 ක ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස 07ත් මාස 10 ත් අතර කාලයක් ගත කර තිබුණි. | 1.Diploma in Tamil as an additional language -No.12<br><br>ලකුණු ලැබී ඇත්තේ ජුනි මාසයේය.<br>අවසන් අදියරේ පාඨමාලාව සමග ඩිප්ලෝමා පාඨමාලාවේ ප්‍රතිඵල නිකුත් කල යුතුය. ඒ සඳහා පදනම් අන්තර් හා උසස් (Foundation,Intermidiate,Higher)පාඨමාලාවල ප්‍රතිඵල අවශ්‍ය වේ. මෙම පාඨමාලා තුන සඳහා සිසුන් හට වෙන වෙනම ලියාපදිංචි අංක එක් එක් පාඨමාලා සඳහා ලබා දී ඇත.<br>ජා.හැ.ප අංකය භාවිතා කර නොතිබුනි. එම නිසා ප්‍රතිඵල සන්සන්දනය සඳහා ගත වූ කාලය අධික විය.<br><br>2. Master of Business Management - No. 04<br>4 වන සෙමෙස්තර විභාගය<br>2018 පෙබරවාරි - අප්‍රේල් අනධ්‍යන වැඩ වර්ජනය බලපා ඇත. ව්‍යාපෘති වාර්තා (project report) ලබාදීමේ අවසන් දිනය ජනවාරි 15 වන දින දක්වා දීර්ඝ කර ඇත. පර්යේෂණ වාර්තා (Thesis) සඳහා වාචික ඇගයීම් පවත්වනු ලැබුවේ 2018 , ජුලි මාසයේය. ඔවුන්ගේ අවසාන වාර්තා භාරදීම කර ඇත්තේ අගෝස්තු මාසයේය. | මෙම තත්ත්වයන් අවම කිරිමට දැනටමත් කටයුතු කර ඇත. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | . | | | 3.Master of Business Management - No. 06<br>1 වන සෙමෙස්තර විභාගය<br>2018 අනධ්‍යන වැඩ වර්ජනය බලපා ඇත. මෙහි MBM 04 විෂය කොටස් 2කින් පවත්වා ඇති අතර II කොටසේ ලකුණු පරීක්ෂක මහතාගෙන් ප්‍රමාද වී ලැබී ඇත. සමහර සිසුන් කොටස් මාරු කර පිළිතුරු ලියා තිබූ අතර එය නිවැරදි කර ගැනීමට සහ ලකුණු අතර විෂමතා නිවැරදි කරගැනීමට කාලයක් ගතවී ඇත.<br>4.Master of Human Resource Management – No. 08<br>2 වන සෙමෙස්තර විභාගය<br>මෙම විභාගය පැවැත්වූයේ 2018 වසරේ අනධ්‍යන කාර්යය මණ්ඩලයේ වැඩ වර්ජනය පවත්වන විටය. එම කාලය තුළදී සමහර උත්තර පත්‍ර, පරීක්ෂක මහත්ම මහත්මීන් වෙත ලබාදීම ගැටලුවක් විය. | |
| | 2.4 | (අ) | | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඊ) වගන්තියට පටහැනිව ප්‍රසම්පාදන සැලැස්ම ඉටුකර තිබූ කාර්යයන්ට ගැලපෙන පරිදි වර්ෂය අවසානයේදී සංශෝධනය කර තිබුණි. | 2018 වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කිරීම 2018 දෙසැම්බර් මස සිදු කර ඇත. | |
| | | (ආ) | | තෝරාගත් සැපයුම්කරුවන්ගෙන් කොන්ත්‍රාත් වටිනාකමින් 10% ක කාර්ය සාධන සුරක්ෂිතයක් ලබාගත යුතු බවට ගිවිසුම් වල ඇතුළත් කර තිබුණද නියැදි පරීක්ෂාවේදී සැපයුම්කරුවන් දෙදෙනෙකුගෙන් වටිනාකම රු.94,000 ක් සඳහා එවැනි කාර්යසාධන සුරක්ෂිත ලබාගෙන නොතිබුණි. | ආයතනයේ ප්‍රමාණවත් පරිදි ගබඩා පහසුකම් නොමැති හෙයින් ඇපකර ඉල්ලා තිබුණද භාණ්ඩ රඳවා තබා ගැනීමට නොහැකි නිසා අවශ්‍යතාවය පරිදි භාණ්ඩ ගෙන්වා ගැනීමට කටයුතු කරන ලදී. | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3. | | (අ) | වෙනත් නිරීක්ෂණ | 2018-2022 ආවරණය වන සේ ආයතනයේ අරමුණු 09 ක් ඉටු කර ගැනීමට අදාලව සකස් කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූල වන සේ ක්‍රියාකාරී සැලැස්ම සකස් විය යුතු වුවද සංයුක්ත සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම් හා එහි ප්‍රතිඵල මැනීම සඳහා යොදා ගන්නා කාර්යසාධන දර්ශක 2018 වර්ෂයට අදාල ක්‍රියාකාරි සැලැස්මෙහි ඇතුළත් වී නොතිබු බැවින් එම දර්ශක පදනම් කරගනිමින් කාර්යසාධනය මැනීමට නොහැකිවී තිබුණි. | 2018-2022 කාලය සඳහා වු ආයතනය සංයුක්ත සැලැස්මෙහි 2018 සඳහා සැලසුම් කරන ලද නමුත් ක්‍රියාකාරි සැලැස්මෙහි අඩංගු නොවන කාර්යන් ලෙස කාර්යයන් 14ක් දක්වා ඇත. නොවැළැක්විය හැකි හේතු මත මෙම කාර්යයන් අදාල වර්ෂය තුළ ඉටු කිරිමට අපහසු වූ බැවින් එම කාර්යයන් 2019 වසරේ සිට ඉදිරියට පවත්වාගෙන යාමට ආයතන පාලන අධිකාරිය තිරණය කරන ලදි. ඒ අනුව 2018 වසරට අදාල ක්‍රියාකාරි සැලැස්ම සංශෝධන කරන ලද අතර එම සංශෝධිත සැලැස්ම අංක 401 දරන ශාස්ත්‍රිය කමිටුව වෙත ඉදිරිපත් කොට ඊට අදාල අනුමැතිය ලබා ගන්නා ලදි. | |
| | | (ආ) | | ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු සංඛ්‍යාව 98 ක් වු අතර තත්‍ය කාර්ය මණ්ඩලය 54ක් වීමෙන් පුරප්පාඩු 44 ක් විය. අනුමත කාර්ය මණ්ඩල තනතුරු වල පුරප්පාඩු සඳහා බඳවා ගැනීමකින් තොරව අනධ්‍යන කාර්යය මණ්ඩලය සඳහා ක්‍රොන්ත්‍රාත් පදනම මත සේවකයන් 17 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළ සේවක වැටුප් ලෙස රු.7,543,227 ක් ගෙවා තිබුණි. | • සමාලෝචිත වර්ෂය තුල ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 98ක් වූ අතර ඉන් 54 ක් තත්ත්ව කාර්ය මණ්ඩලයට අයත් වේ. 2018 වර්ෂය තුල තත්ත්ව කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 15 පිරවීමට කටයුතු කරන ලදී.<br>• කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව කාර්ය මණ්ඩල අනුමැතිය ලබා දීමේදී කොන්ත්‍රාත් පදනම මත සේවකයන් බඳවා ගැනීමට 2017 වර්ෂය තුළදීද අනුමැතිය ලබා දී ඇති අතර ඔවුන් ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට හිලව් වශයෙන් බඳවාගෙන නොමැති බව දන්වමි. | එම |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | (ඈ) | | අයවැය සංඛ්‍යා සමග සැසඳීමේදී ස්ථාවර වත්කම් අත්පත් කර ගැනිම වෙනුවෙන් අයවැය ගත වියදම ඉක්මවා සත්‍ය වියදම සියයට 654 කින් වැඩි වී තිබු අතර,නඩත්තු වියදම අයවැයගත වියදම ඉක්මවා සියයට 50 කින් වැඩි වී තිබුණි. ඒ අනුව ආයතනයේ අයවැය තාත්වික අයුරින් සකස් කර ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි. | 2019 වර්ෂයේ සිට අයවැය ලේඛණයේ පවතින අඩුපාඩු අවම කර ගැනීමටත්, අයවැය ලේඛනය හා නොසැසඳෙන අවස්ථාවන්හි දී අයවැය ලේඛණය ප්‍රතිශෝධනය කිරීමටත් අදාල නිලධාරින්ට උපදෙස් දෙන ලදී. | එම |
| | | (ඇ) | | අත්තිකාරම් මුදලින් අවස්ථා 27 කදී ලබාගත් වටිනාකම රු.580,655 ක්වු අත්තිකාරම් දින 28 සිට 185 ක් දක්වා ද තවත් රු.206,650 ක්වු අත්තිකාරම් 03 ක් දින 50 සිට 268 දක්වා වු කාල පරාසයක් ප්‍රමාද වී තිබුණි. තවද රු. 100,000 ක සීමාව ඉක්මවා පුද්ගලයින් 04 දෙනෙකුට අවස්ථා 12කදී රු.3,864,025 ක අත්තිකාරම් ලබා දී තිබුණි. | ඇමුණුමෙහි සඳහන් අත්තිකාරම් වල පියවීම් දිනය ලෙස සඳහන් වනුයේ එම අත්තිකාරම් පියවීමට අදාල වවුචර් මුල්‍ය අංශයට ඉදිරිපත් කල දිනය වන අතර සත්‍ය වශයෙන් එම අත්තිකාරම් වල ඉතිරි මුදල් ඇත්නම් එය පියවා අවසන් කල දිනය නොවේ.<br><br>කෙසේ වුවද අත්තිකාරම් පියවීම් ද මේ වන විට විධිමත්ව සිදු කරනු ලබයි.<br><br>ඉදිරියේදී තවදුරටත් අනුකූලව කටයුතු කිරිමට උපදෙස් දී ඇත. | අත්තිකාරම් පියවීම මේ වන විට විධිමත්ව සිදු කරයි. |
| | | (ඉ) | | ආයතනයේ ගනුදෙනු සඳහා බැංකු ජංගම ගිණුම් 07 ක් පවත්වාගෙන යන අතර එහි වර්ෂය අවසානයට ශුද්ධ ශේෂය රු. 42,600,104 ක් විය. එම ශේෂ මුදල් පොත අනුව සෘණ රු.1,251,321 සිට රු. 37,406,915 ක ධන ශේෂය දක්වා වු පරාසයක් තුල පැවතුණි. එම ජංගම ගිණුම්වල විශාල වශයෙන් මුදල් රැස් කිරීම මුල්‍ය, කළමනාකරණයේ දුර්වලතාවයක් ලෙස නිරික්ෂණය විය. | | අදාල අරමුදල් 2019 ජනවාරි මාසයේ ස්ථාවර තැන්පතු වල ආයෝජනය කරන ලදි. |